# ලෝකාලෝකය

2026 ජූලි - සැප්තැම්බර් කලාපය

## ස්වාමින්වහන්සේ තුළද,
## උන්වහන්සේගේ ශක්තියේ බලවත්කමෙහිද
## බලවත් වෙයල්ලා
## (එපීස 6:10)

ක්‍රිස්තියානි සහෝදර මධ්‍යස්ථානය
අංක - 07, විවේකානන්ද පාර, වැල්ලවත්ත, කොළඹ 06.
දුරකථන අංක : 011 2581901




# මිදිවත්ත සහ නපුරු ගොවීන්

ආදර දුවේ පුතේ, ඔන්න අදත් මම ඔයාලට ලස්සනම ලස්සන කතන්දරයක් කියන්නයි යන්නේ. මේ කතන්දරය තියෙන්නේ ශුද්ධ බයිබලයේ **ලූක් 20 වැනි පරිච්ඡේදයේ 9 වැනි පදයේ සිට 15 වැනි පදය** දක්වායි. ඉතිං දරුවනේ ඔයාලා ළඟත් බයිබලයක් තියෙනවනම් මේ කතන්දරය කියවලා බලන්න. මෙය යේසුස්වහන්සේ විසින් කියූ උපමා කතාවක්.

එක මනුෂ්‍යයෙක් සරුසාර මිදිවත්තක් වවා, එය ගොවීන්ට බදු දී බොහෝ කාලයකට වෙන රටකට ගියා. ඉතිං පල නෙලන කාලයේ දී ඒ මනුෂ්‍යයා තමන්ගේ කොටස ගැනීම සඳහා ඔවුන් වෙතට ඔහුගේ දාසයෙක් යැව්වා. නමුත් ගොවීන් දාසයාට තලා ඔහු හිස් අතින් යන්නට ඇරියා. පසුව ඔහු වෙන දාසයෙකු යැව්වා. ගොවීන් ඔහුටත් තලා නිගා කර ඔහුන් හිස් අතින් යැව්වා. නැවත ඔහු තුන්වැන්නෙකුද යැව්වා. ඔවුහු ඔහුටත් තුවාල කර පිටත දැම්මා. එවිට මිදිවත්තේ ස්වාමියා කථාකොට "මම මක් කරම්ද? මාගේ ප්‍රේමවන්ත පුත්‍රයා යවමි, සමහර විට ඔවුන් ඔහුට ගෞරව කරනවා ඇතැ"යි කිව්වා. නුමුත් ගොවීහු ඔහු දැක එකිනෙකා කතා කොට මොහු උරුමක්කාරයාය, උරුමය අපට වෙන පිණිස මොහු මරමුයි කියා, ඔහු මිදිවත්තෙන් පිටත දමා මැරුවා.

ඉතිං දරුවනේ මේ උපමා කතාවේ දැක්වෙන පරිදි මිනිසෙක් මිදිවත්තක් වවා ගොවීන්ට දී බොහෝ කලකට පිටරටකට යෑම නම්, දෙවියන්වහන්සේ මේ ලෝකයේ සියල්ල අලංකාර ලෙස නිර්මාණය කර මිනිසාට එහි පාලනය හා නිදහස බාර දීමට සමාන කළ හැකිය.

වත්තේ හිමිකරු විසින් එවන ලද දාසයන්ට සමාන වන්නේ දෙවියන්වහන්සේගේ අණට පිටුපා පාපයේ ගැලී ජීවත් වන මිනිසුන්ට එය වටහා දී, ඔවුන් පසුතැවිල්ලට ගෙන එන පිණිස එවූ දිවැසිවරුන් පිළිබඳවයි. මේ දිවැසිවරුන් සම්බන්ධයෙන් මිනිසා ක්‍රියා කළේ ගොවීන් විසින් මිදිවත්තේ හිමිකරුගේ දාසයන්ට ක්‍රියා කළ ආකාරයටමයි.


ඉතිං දරුවනේ අවසානයේ මිනිසා පාපයෙන් ගලවා ගැනීම උදෙසා දෙවියන්වහන්සේ විසින් තම එකම ප්‍රේමවන්ත පුත්‍රයා මේ ලෝකයට එවූ සේක. ඒ යේසුස් වහන්සේය. උපමාවේ සඳහන් පරිදි ගොවීන් මිදිවත්තේ හිමිකරුගේ පුත්‍රයාට කළ ලෙස මිනිසුන් විසින් යේසුස්වහන්සේ කුරුසි පත් කොට මරණයට පත් කළෝය. ඔව් දරුවනේ අපි දන්නවා යේසුස්වහන්සේ මිනිසෙකු ලෙස මේ ලෝකයට පැමිණ අවසානයේ දුක් වේදනා විඳ කුරුසියේ මරණය වින්දේ අපි සියලු දෙනාගේම පාපයේ දඬුවම ගෙවන්නටයි. ඒ කුරුසිය මතින් ගැලූ උන්වහන්සේගේ අනර්ඝ රුධිරයෙන් අපේ පාප සියල්ල සෝදා අප පවිත්‍ර කොට අපි උන්වහන්සේගේ දරුවන් බවට පත් කරගත් සේක. ඔව් දරුවනේ ඒ නිසා දැන් අපට උන්වහන්සේ තුළ සිටින්නට පුළුවන්. ඉතිං පුංචි ඔයාලත් දේව වචනයට එකඟව ඇදහිල්ලේ ජීවිතයක් ගත කරමින් දෙවියන්වහන්සේ අප උදෙසා සැලසුම් කළ යහපත් මාර්ගයේ ගමන් කරමු.

ඔයාලා හැමදෙනාටම දෙවියන්වහන්සේගේ ආශිර්වාදය ලැබේවා.



**- තබීතා නැන්දා -**

# දෙවියන්වහන්සේ පිළිබඳ දැනුමේ හා අවබෝධයේ ඌනතාවය




**"සදාකාල ජීවනය නම්, එකම සැබෑ වූ දෙවියන්වහන්සේද, ඔබ සහ ඔබ විසින් එවන ලද තැනැත්තා වන යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ඔවුන් විසින් ඇඳින ගැනීමය" (යොහාන් 17:3).**

ප්‍රිය සහෝදර සහෝදරියනි, මාස කිහිපයකින් පසු ලෝකාලෝකය සඟරාවක් ඔබ අතට පත් කිරීමට දෙවියන්වහන්සේ දුන් කරුණාව ගැන උන්වහන්සේට ප්‍රශංසා වේවා. ඔබ මෙම සඟරාව කියවා තව කෙනෙකුට ලබා දෙන්න. එමෙන්ම මෙම සඟරා සේවය පිළිබඳව යාච්ඤා කරන මෙන් මම ඔබ සැමගෙන් ඉල්ලා සිටිමි.

වර්තමානයේ දෙවියන්වහන්සේගේ සේවය දෙස බැලූ විට අපට පෙනෙන්නේ එය දියුණු වී වර්ධනය වී ඇති බවකි. සභා සංඛ්‍යාව හා දේව සේවක සංඛ්‍යාව ඉහළ ගොස් ඇති බව මාගේ අදහසයි. එමෙන්ම එක එක සභා හා ඇදහිලිවන්තයන් ගත් කළ ඔවුන් එකිනෙකාට වෙනස් ආකාරයට සේවය කරන බවයි පෙනී යන්නේ. බොහෝවිට නමස්කාරය, ප්‍රශංසාව, යාච්ඤාව, සංගීතය හා සුව කිරීම් වැනි දෑ වැඩි වශයෙන් සිදුවේ. ඒ පිළිබඳව දෙවියන්වහන්සේට ප්‍රශංසා කරමි.

එහෙත් මෙහි තිබෙන ප්‍රධාන ප්‍රශ්නය නම් අපි දෙවියන්වහන්සේව හරියාකාරව නොදැනීමයි. සමහරවිට අපි දේවවචනය දනිමු. එහෙත් දෙවියන්වහන්සේ පිළිබඳව දැනුම නැතිව සිටින්නෙමු. බොහෝ දුරට අප නමස්කාර කරන්නේ, යාච්ඤා කරන්නේ අප මනසින් මවාගත් දෙවිකෙනෙකුටය. අපගේ පරණ ආගමික පදනම, සංස්කෘතිය, බුද්ධිය, හෝ කියවා ඇති පොත පත, අසා ඇති දේශනා වලින් අප වෙත පිළිගැන්වූ දෙවිකෙනෙක් ගැන

චිත්ත රූපයක් සෑම කෙනෙකුගේ ම මතකයේ තිබේ. නමුත් බයිබලය අපට පිළිගන්වන, එළිදරව් කරන, පරමාධිපත්‍ය වූ සර්වබලධාරී, ස්වයංභූ, ප්‍රේමණීය, ස්වර්ගයේ වැඩ සිටින දෙවියන්වහන්සේ පිළිබඳ දැනුමේ ඌනත්වයක් අප සැමටම ඇත. එම ඌනතාවය කරණකොටගෙන ඇදහිලිවන්ත අපගේ ආත්මික ජීවිතයේ මෙන්ම සභාවද විවිධ ආත්මික රෝගාබාධ වලට ගොදුරු වේ. දෙවියන්වහන්සේ දැනගැනීම යනු උන්වහන්සේ ගැන තොරතුරු දැන ගැනීම නොව, උන්වහන්සේව පුද්ගලිකව දැන ගැනීම වේ. මෙය සම්බන්ධතාවයකි. බොහෝ අය උන්වහන්සේ ගැන තොරතුරු විස්තර දන්නවා විය හැක. එහෙත් "දෙවියන්වහන්සේව" දන්නා අය සිටින්නේ ස්වල්පයකි.

දෙවියන්වහන්සේ පිළිබඳ අපගේ සංකල්පය දුර්වල වූ විට, එනම් උන්වහන්සේගේ චරිතය අප හරි හැටි නොදන්නා විට, අපගේ නමස්කාරය, යාච්ඤාව, කීකරුකම, භක්තිය, ගායනය හා ප්‍රශංසාව, දුර්වල එකක් බවට පත් වේ. අප බයිබලය කියෙව්වත්. එහෙත් වචනය ඉදිරියේ වෙවුලන්නේ නැත **(යෙසායා 6:5)**.

ප්‍රිය සහෝදර සහෝදරියනි, මාගේ යාච්ඤාව නම්: අප සෑම දෙනෙක්ම දෙවියන්වහන්සේ පිළිබඳ සංකල්පය නැතහොත් අපගේ චිත්තරූපය උසස්කර ගත යුතු බවටයි. අප බයිබලය කියවන අය නොව අප " දෙවියන්වහන්සේ" කියවන අය විය යුතුය. අප ප්‍රශංසා ගී ගායනා කරන අය නොව අප "දෙවියන්වහන්සේව" ගායනා කරන අය විය යුතුය. බයිබලය තුළින් අපට එළිදරව් කර දෙන බයිබලීය දෙවියන්වහන්සේ පිළිබඳ අපගේ සංකල්පය උසස් කර ගනිමු. බයිබලීය "දෙවියන්වහන්සේව හා ක්‍රිස්තුස්වහන්සේව" දැන ගැනීමට උන්වහන්සේගේ චරිතය කියවීමට නිහඬව කාලය ගත කරන්න. මා මේ ඔබ වෙත ඉදිරිපත් කළ අදහස තේරුම් ගැනීමට ශුද්ධාත්මයාණන්වහන්සේ ඔබ සැමට උපකාර කරන සේක්වා.

- සංස්කාරක -
**එස්. මෙත්තානන්ද**
**077 8813197**

# ජයග්‍රහණය භුක්ති විඳීම

ප්‍රිය සහෝදර සහෝදරිය, දෙවියන් වහන්සේ තුළ ඔබ ජයග්‍රාහී ජීවිතයක් ගත කරනවාදැයි කවුරුන් හෝ ඔබෙන් විමසුවොත් ඔබ එම පුද්ගලයාට දෙන පිළිතුර කුමක්ද?

**"මාගේ ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මාගේ පාප වලට වන්දි ගෙව්වා, මට සදාකාල ජීවනය තිබෙනවා, මම ජයග්‍රහණය කර තිබෙනවා"** යැයි ඔබ සතුටින් පිළිතුරු දෙයි.

"සැබැවින්ම දෙවියන්වහන්සේට ස්තූති වේවා" උන්වහන්සේ අපේ පාප වල වන්දිය ගෙවා දමා අපි උන්වහන්සේගේ දරුවන් බවට පත් කරගනිමින් අපට ජයග්‍රාහී ජීවිතයක් ලබා දී තිබීම ගැන.

නමුත් ඔබ මේ ජයග්‍රාහී ජීවිතය, ජීවත් වෙන්නේ කොහොමද? ඔබ ගැලවීම ලබා ගත් දවසේ පමණක් එහි ප්‍රීතිය භුක්ති විඳ පසුව එම ජයග්‍රහණය අමතක වී කෙමෙන් කෙමෙන් අඩපණ වූ, අස්ථාවර, පරාජිත ස්වභාවයකට ඔබගේ ජීවිතය පත් වෙමින් තිබෙනවාද? සැබැවින්ම ජයග්‍රහණය සැමරිය යුත්තේ කොහොමද? මේ අසමසම ජයග්‍රහණය අප සෑම දවසකම සැමරිය යුතුමය. ඒ දිනපතාම ප්‍රියසාද පවත්වමින් නොව, දිනපතාම අප ස්වාමී වූ යේසුස්වහන්සේ තුළ ජයග්‍රාහී ලෙස ජීවත් වීමට, දිනපතාම අත් හැරීම, විශ්වාසය සහ උන්වහන්සේ සමඟ සමීපව ගමන් කිරීමට ඉගෙනගැනීම අනිවාර්යය වේ. ජයග්‍රහණය ආරම්භ වන්නේ අපට ශක්තිය දෙන ක්‍රිස්තුස්වහන්සේ හඳුනාගත් විටයි. **"මා බලවත්කරන්නා වූ තැනැන්වහන්සේ තුළ මට සියලු දේ කරන්ට පුළුවන" (පිලිප්පි 4:13).**

ජයග්‍රාහී ජීවිතයක් ආරම්භ වන්නේ යේසුස්වහන්සේ සමඟ පුද්ගලික සම්බන්ධතාවයකින්ම පමණි. දිනපතා යාච්ඤාවටත්, දෙවියන්වහන්සේගේ වචනය කියවීමටත් කාලය කැප කරන්න. අපි පළමුව උන්වහන්සේ සොයන විට අනෙක් සියලු දේ නිසි ලෙස සිදු වේ. **"නුමුත් පළමුකොට උන්වහන්සේගේ රාජ්‍යයද, උන්වහන්සේගේ ධර්මිෂ්ඨකමද සොයන්න, මේ සියල්ලත් නුඹලාට දෙනු ලබන්නේය" (මතෙව් 6:33).** මෙම දිනපතා සම්බන්ධතාවය අපගේ ශක්තිය නැවත පිහිටුවා අපට අභියෝගවලට මුහුණ දීමට පැහැදිලි අවබෝධය ලබා දෙයි.

තවත් වැදගත් කරුණක් වන්නේ, අසීරු මොහොතවල පවා දෙවියන්වහන්සේව විශ්වාස කිරීමයි. ජයග්‍රහණය යනු ගැටලු නැති ජීවිතයක් නොව, විශ්වාසය තුළින් ඒවා ජයගන්නා ජීවිතයකි. **"මක්නිසාද දෙවියන්වහන්සේගෙන් උපන් යමක් ඇද්ද එය ලෝකයෙන් ජය ගන්නේය. ලෝකයෙන් ජයගෙන තිබෙන්නේ අපේ ඇදහිල්ලය" (1 යොහාන් 5:4).** පරීක්ෂාවන් එන විට දෙවියන් අප සමඟ සිටින බව දැනගෙන අපි ස්ථිරව සිටිමු.

ජයග්‍රාහීව ජීවත් වීම යනු උන්වහන්සේගේ වචනයට කීකරුව සහ උන්වහන්සේට ආදරයෙන් ජීවත්වීම වේ. යේසුස්වහන්සේ එකිනෙකාට ආදරය කිරීමට, සමාව දීමට සහ උන්වහන්සේගේ සුභාරංචිය ප්‍රකාශ කිරීමට අපට ඉගැන්වූ සේක. **"නපුරුකමෙන් පරාජය නොවී, යහපත්කමෙන් නපුරුකම පරාජය කරන්න" (රෝම 12:21).** කරුණාව දැක්වීම, ඉවසීම සහ සමාවදීමට තෝරා ගැනීම දිනපතා ජීවිතයේ ආත්මික ජය ගෙනෙයි. ජයග්‍රහණය දැනටමත් ක්‍රිස්තුස්වහන්සේ තුළින් ලැබී ඇති බව මතක තබාගන්න. **"නුමුත් අපගේ ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කරණකොටගෙන අපට ජයදෙන්නා වූ දෙවියන්වහන්සේට ස්තූති වේවා" (1 කොරොන්ති 15:57).** දැන් අපි ජයග්‍රහණය ලබා ගැනීමට සටන් කරනවා නොව, දෙවියන්වහන්සේ ලබා දුන් ජයග්‍රහණයෙන් ජීවත්වේ.

සැම දිනකම දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාසයෙන් ගමන් කරන්න. උන්වහන්සේ වචනය තුළ මුල් බැස සිටින්න සහ උන්වහන්සේගේ පොරොන්දු විශ්වාස කරන්න. යේසුස් වහන්සේ සමඟ දිනපතා ජයග්‍රාහී ජීවිතයක් ජීවත්වන්නේ කෙසේද?

- දිනපතා යේසුස්වහන්සේ සමඟ සම්බන්ධ වී සිටින්න.

ජයග්‍රහණය ආරම්භ වන්නේ ක්‍රිස්තුස්වහන්සේ සමඟ සමීප සම්බන්ධතාවයකිනි. යාච්ඤා කිරීමටත් වචනය කියවීමටත් කාලය කැප කරන්න.

**"මා තුළ පැවතෙන්න. මමත් නුඹලා තුළ පවතින්නෙමි........" (යොහාන් 15:4)**

- සෑම දෙයකදීම දෙවියන්වහන්සේට පළමුවැනි ස්ථානය දෙන්න.

දෙවියන්වහන්සේ ඔබේ ප්‍රමුඛතාවය වූ විට, අපගේ ජීවිතය උන්වහන්සේගේ කැමැත්තට අනුව සකස් වේ.

**"නුමුත් පළමු කොට උන්වහන්සේගේ රාජ්‍යයද, උන්වහන්සේගේ ධර්මිෂ්ඨකම ද සොයන්න..." (මතෙව් 6:33)**

- දර්ශනයෙන් නොව විශ්වාසයෙන් ජීවත්වන්න

ජීවිතයේ සමහර අවස්ථාවන් කොයිතරම් අසීරු වුණත් දෙවියන්වහන්සේගේ සැලැස්ම විශ්වාස කරන්න.

**"මක්නිසාද අප හැසිරෙන්නේ පෙනීමෙන් නොව ඇදහීමෙන්ය." (2 කොරොන්ති 5:7)**

- ඔබගේ බලයෙන් නොව දෙවියන් වහන්සේගේ බලයෙන් ජීවත්වන්න.

ඔබගේ ජීවිත අභියෝග වලට තනිවම මුහුණ දීමට අවශ්‍ය නොවේ. යේසුස්වහන්සේගේ ශක්තිය ලබාගන්න.

**"මා බලවත් කරන්නා වූ තැනැන්වහන්සේ තුළ මට සියලු දේ කරන්ට පුළුවන" (පිලිප්පි 4:13).**

- විශ්වාසයෙන් ජය ගන්න.

ජයග්‍රහණය ලැබෙන්නේ දෙවියන්වහන්සේගේ පොරොන්දු විශ්වාස කිරීමෙනි.

**"ලෝකයෙන් ජයගෙන තිබෙන්නේ අපේ ඇදහිල්ලයි" (1 යොහාන් 5:4).**

- දෙවියන්වහන්සේගේ වචනයට අනුකූලව ජීවත්වන්න.

උන්වහන්සේගේ ආඥා පිළිපදිමින් ජීවත්වීමෙන් සමාදානයෙන් පිරුණු හා ජයග්‍රාහී ජීවිතයක් උරුම වෙයි.

**"ඊට වඩා දෙවියන්වහන්සේගේ වචනය අසා එය පවත්වන්නෝ සැබැවින්ම වාසනාවන්තයෝ යැයි කී සේක" (ලූක් 11:28).**

- ආදරය කරන්න, සමාව දෙන්න.

ජයග්‍රහණය යනු ද්වේශය ජයගනිමින් ක්‍රිස්තුස්වහන්සේගේ ආදරය පෙන්වීමයි.

**"නුඹලා එකිනෙකා කෙරෙහි ගුණවන්තව අනුකම්පා ඇතුව සිට, ක්‍රිස්තුස්වහන්සේ තුළ දෙවියන්වහන්සේ නුඹලාට කමාවුන ලෙසම නුඹලාත් එකිනෙකා ට සමාවෙන්න" (එපීස 4:32).**

- පරීක්ෂාවට විරුද්ධව සිටින්න.

පාපයෙන් ජයගැනීමට දෙවියන්වහන්සේ සෑම විටම මාර්ගයක් සලසයි.

**"නුඹලාට පරීක්ෂාව ඉවසිය හැකි වන පිණිස ඒ සමඟ ගැළවෙන මාර්ගය ද සාදා දෙන සේක" (1 කොරොන්ති 10:13).**

- ක්‍රිස්තුස්වහන්සේ තුළ ජයග්‍රහණය කලින්ම ලබා දී ඇති බව මතක තබා ගන්න.

ඔබ ජයග්‍රහණය සටන් කරනවා නොව ජයග්‍රහණයෙන් ජීවත් වන්න.

**"නුමුත් අපගේ ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කරණකොට ගෙන අපට ජය දෙන්නා වූ දෙවියන්වහන්සේට ස්තුති වේවා" (1 කොරොන්ති 15:57).**

- ඔබගේ සිත දෙවියන්වහන්සේ මත තබා ගන්න.

සැබෑ සාමය සහ ජය ලැබෙන්නේ සිත උන්වහන්සේ මත ස්ථිර වූ විටයි.

**"ඔබ කෙරෙහි සිත තබා සිටින තැනැත්තා ඔබ කෙරෙහි විශ්වාස කරන බැවින්, ඔබ ඔහු ශාන්ත සමාදානයෙන් ආරක්ෂා කරන සේක." (යෙසායා 26:3)**

දිනපතා යේසුස්වහන්සේව කේන්ද්‍ර කරගෙන ජීවත්වන්න. එවිට සැබෑ ජයග්‍රාහී ජීවිතය ඔබට අත්විඳීමට හැකිවනු ඇත.

**- ශෂිලා ද සිල්වා -**

# කණ්ඩායම් දෙක

වෙනදා දෙසැම්බර් මාසයට පිවිසෙන මැදියම් රෑ දොළහට අපගේ මේ ප්‍රදේශ පුරාම රතිඤ්ඤා පුපුරන හඬ පැතිර යයි. දෙදහස් විසිපහ නත්තල් මාසය උදා වන විට ඒ හඬ ඇසුනේ නැත. ඒ වෙනුවට මිනිසුන්ගේ විලාප හඬ වායු ගෝලයට එක් වූයේ හදවත් කම්පා කරමිනි. දිට්වා සුළි කුණාටුව කළ මහා විනාශය අති මහත්ය. මෙතෙකැයි කියා නිම කල නොහැකිය. මෙසේ වසර අවසන් වූයේ මිනිස් ජීවිත ගණනාවක්ම මළවුන් අතරට ගෙන යමිනි. අතුරුදන් වූ අය ද බොහෝය. දේපළ විනාශය අති විශාලය. මුදල්, රන් භාණ්ඩ, වටිනා සම්පත් ගස්, කදු වලට යට විය.



## මේ මහා විපතට හේතුව කුමක්ද?

මේ සම්බන්ධව ශුද්ධ වූ බයිබලයට අනුව කරුණු විමසා බැලීමට පෙර ප්‍රසිද්ධ ජනමාධ්‍ය තුළින් එළි දැක්වුණු ප්‍රකාශයක් වෙත අපි අවධානය යොමු කරමු. 2025 දෙසැම්බර් මස 30 ඉරිදා දින දිවයින පුවත්පතේ පළමු කතු වැකියේ කොටසක් පහත දැක්වේ.

“.......... මීට අවුරුදු දහස් ගණනකට පෙර සිදු වූයේ යැයි කියන ගංවතුර මිත්‍යාවක් නොව සැබෑවක් බව පරීක්ෂකයන් විසින් සොයාගෙන තිබේ. එම ගංවතුරේ ප්‍රධාන චරිත තුනක් තිබෙනවා. පළමුවැන්නා දෙවියන්වහන්සේය. දෙවැන්නා දෙවියන්වහන්සේගේ පෞද්ගලික මිතුරෙකු වූ නෝවා නැමැති ධර්මිෂ්ඨ මනුෂ්‍යයෙක්. තුන්වැන්නා යක්ෂයා හෙවත් සාතන්. තමන්වහන්සේ ළගදීම ගංවතුර එවා, ........ ශුද්ධ පවිත්‍ර කරන බැවින්, විශාල නැවක් සාදාගෙන සිය පවුල සමඟ එහි නැගී ජීවිතය බේරාගන්නා ලෙස දෙවියන්වහන්සේ නෝවාට දැනුම්දීලා තිබුණා. ඉන්පසු නෝවා ලෑලි සොයා ගෙන ඇවිත් විශාල නැවක් සාදා, සිය පවුලද, සියළු වර්ගවල සතුන්ගෙන්ද සමග නැවට නැගී ගංවතුර ගැලූවිට ජීවිතය බේරා ගත් බව සඳහන් වේ.”

මේ සිදුවීම පිළිබඳ සම්පූර්ණ පැහැදිලි විස්තරය ශුද්ධ වූ බයිබලයේ **උත්පත්ති පොතේ 6,7,8,9** යන පරිච්ඡේද වල දැක්වේ.

ශුද්ධ බයිබලයේ සත්‍යතාවය නෝවාගේ ජලගැල්ම මිත්‍යාවක් නොව සත්‍යයක් බව සනාථ වීමත් සමග ශුද්ධ බයිබලයේ සත්‍යතාවය ද තහවුරු වේ.

(මෙයට අමතරව ශුද්ධ ලියවිල්ලේ සත්‍යතාවය තහවුරු කළ බොහෝ විද්‍යාත්මක, පුරාවිද්‍යාත්මක සාක්ෂි තිබේ.)

සර්ව සාධාරණ දෙවියන්වහන්සේ පෙර දැනුම්දීමකින් තොරව ලෝකයට විනිශ්චයන් පමුණුවන්නේ නැත. එකල ජීවත් වූ මනුෂ්‍යයන්ගේ තත්වය **උත්පත්ති පොතේ 6:5** සඳහන් වේ. **“මනුෂ්‍යයාගේ දුෂ්ඨකම පොළොවෙහි මහත් බවද, ඔහුගේ සිතේ කල්පනාවල කවර අයුරකින්, නිරන්තරයෙන් නපුරුවට තිබෙන බවත්, ස්වාමින්වහන්සේ දුටු සේක.”** මේ සම්බන්ධව යේසුස්වහන්සේද සිහිපත් කළ සේක. **“ මක්නිසාද ජලගැල්මට පළමු දවස් වලදී නෝවා නැවට ඇතුල් වූ දවස දක්වා, ඔව්හු කමින්, බොමින් සරණපාවා දෙමින් සරණපාවා ගනිමින් සිටියෝය. ජලගැල්ම පැමිණ සියල්ලන්ම ගසාගෙන යන තුරු ඔවුහු නොදැන සිටියෝය.”**

කෑම බීම සරණ යෑම වරදක් නොවේ. මනුෂ්‍යයා මේ ජීවිතයේ කාරණා ගැන පමණක්ම සොයමින් ප්‍රියසාද පවත්වමින් පිළිකුල් පාප තෘෂ්ණා වල

ඇලී ගැලී සිටියා මිස දෙවියන්වහන්සේගේ වචනය විශ්වාස කළේ නැත. නැව හදන්නට නෝවාට සෑහෙන කාලයක් ගතවන්නට ඇත. එම කාලය පාපය අත්හැර දෙවියන්වහන්සේ වෙතට හැරෙන ලෙස නෝවා අවවාද කරන්නටද ඇත. මේ කාලයේදී වැස්ස හෝ ගංවතුර ගැන කිසිවෙක් දැන සිටියේ නැත. නමුත් නෝවා තමා නුදුටු දේ ගැන දෙවියන්වහන්සේගේ වචනය විශ්වාස කර කීකරු වුණේය.

## නෝවාගේ චරිතය

දෙවියන්වහන්සේ නෝවාට දුන් චරිත සහතිකය මෙසේය.

**"නෝවා....**
**1- ධර්මිෂ්ඨ මනුෂ්‍යයෙක්ව සිටියේය.**
**2- තමාගේ පරම්පරාවේ සම්පූර්ණව සිටියේය,**
**3- ඔහු දෙවියන්වහන්සේ සමඟ හැසිරුණේය"**
**(උත්පත්ති 6:9)**

මනුෂ්‍යයා ජීවත්වන්නේ තමාගේම ධර්මිෂ්ඨකම තුළය. යේසුස්වහන්සේ කෙරෙහි අදහාගත්විට අපට උන්වහන්සේගේ ධර්මිෂ්ඨකම ලැබේ. **"එනම් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි අදහන්නා වූ සියල්ලන්ට ලැබෙන ධර්මිෂ්ඨකමය." (රෝම 3:23)** එහි නියම අරුත වන්නේ ක්‍රිස්තුස්වහන්සේම අප තුළ ප්‍රකාශ වීමයි. එනම් උන්වහන්සේගේ ගුණාංග අප තුළින් පිළිබිඹු වීමයි.

## නෝවා සම්පූර්ණව සිටියේය.

අලුත උපන් දරුවකු එම තත්වයේම සිටින්නේ නැත. දවසින් දවස උසින් මහතින් බරින් වැඩී සම්පූර්ණ මනුෂ්‍යයකු බවට වර්ධනය වේ. අපි ක්‍රිස්තුස්වහන්සේ අදහාගැනීම තුළින් නව ජීවිතයකට ආත්මිකව ඉපදුණෙමු. **"සම්පූර්ණ පුරුෂකමටත්, ක්‍රිස්තුස්වහන්සේගේ සම්පූර්ණ වූ උස මහතේ ප්‍රමාණයටත් අපි සියල්ලන් පැමිණෙන තෙක්........" යනුවෙන් එපීස 4: 12** සඳහන් වේ. ජන්මික මනුෂ්‍යයාගේ වැඩීමට සීමාවක් තිබේ. ආත්මික මනුෂ්‍යයාගේ වැඩීමට සීමාවක් නැත. යේසුස්වහන්සේ නැවත පැමිණෙන තෙක් අපි ආත්මික යෝධයන් මෙන් වැඩෙමු.

## නෝවා දෙවියන්වහන්සේ සමඟ හැසිරුණේය.

නෝවා සහ දෙවියන්වහන්සේ අතර ඉතාම සමීප ඇසුරක් විය. **"නුඹලා මාගේ මිත්‍රයන්"** යැයි දෙවරක්ම යේසුස්වහන්සේ පැවසූ සේක. **(යොහාන් 15: 14,15)** මිත්‍රත්වය සමීප ඇසුරක් පෙන්නුම් කරයි. උන්වහන්සේ අපගේ එකම කල්‍යාණ සුමිතුරාණෝය. අපට පුරුදු වචන වලින් කීවොත් අපගේ අඹ යහළුවාය. යාච්ඤා වේලාවේදී, දේව වචනය මෙනෙහිකරන වේලාවේදී, සභාවේදී දෙවියන්වහන්සේ සමඟ හැසිරුනත් සමාජයේ උන්වහන්සේ සමඟ හැසිරෙන්නේ කෙසේදැයි ඔබට ගැටලුවක් මතුවන්නට පුළුවන. සමාජයට පිවිසෙන්නේ මම තනිව නොවේ. ඔබේ ආත්මය තුළ ශුද්ධාත්මයාණෝ ඔබ සමඟ ගමන්කරන සේක. එසේම ඔබ දම්වුකමේ (යේසුස්වහන්සේ) පැළඳ සිටියි. මෙසේ ඔබට ලෝකයේ මලපත් වලින් ආරක්ෂාව සැලසේ.

## නැවේ දොරටුව

මේ සිද්ධියේ අපි කණ්ඩායම් දෙකක් දකිමු. කන්ද මත නැව තුළ සුරැකිව සිටි. නෝවා සහ පවුල නම් කුඩා කණ්ඩායම සහ පොළොව මත පිළිකුල් පාප වල ඇලී සිටින විශාල කණ්ඩායම. ඔවුහු ප්‍රිය සාද පවත්වමින්, කමින් බොමින් පාපය තුළ කිමිදෙමින් සතුටු වෙති. අද තත්ත්වය ද මෙලෙසමයි. දේව දරුවන් සීමිත පිරිසක් සභාව නම් නැව තුළ ස්වාමීන්වහන්සේ සමඟ ප්‍රීතියෙන් සිටිති. සභාව නැමැති නැව යේසුස්වහන්සේ වන පර්වතය මත සුරක්ෂිතය. ඉතාම නුදුරු දිනක යේසුස්වහන්සේ වළාකුල් මතින් වූ සභාව රැගෙන යෑමට පැමිණෙන සේක. දෙවියන්වහන්සේ නෝවාගේ කණ්ඩායම නැවට ඇතුල් වූ විට දොර වැසූ සේක. යේසුස්වහන්සේ මධ්‍යාකාශයට පැමිණ සභාව රැගෙන ගිය පසු කරුණාවේ දොරටුව වැසේ. පොළොවේ ඉතිරි වන සෙනඟට ඉතාම භයානක පීඩා කාලයකට මුහුණ දීමට සිදු වේ. ඔබ ඉන්නේ කුමන කණ්ඩායමේද?

**- ඩී. එම්. ජයමහ -**
**ලෝකාලෝකය සඟරාවේ හිටපු සංස්කාරකවරයෙකි.**

# චීනය
# බයිබලීය අනාවැකි ඇසින්




ලෝකයේ වැඩිම ජනගහනයක් ජීවත්වන රට වන සහ ලෝකයේ යුධ ශක්තිය අතින් ඉදිරියෙන්ම සිටින්නා වූ රටක් වන චීනය පිළිබඳව බයිබලීය ඇසින් බලමු.

මෑතකදී සිදු වුනා වූ ලෝකයේම අවධානය දිනා ගත් සිදුවීමක් ලෙස සැප්තැම්බර් 3 වන දින බීජිං නුවර මහා යුධ සේනා පෙළපාලියක් මුළු ලෝකයටම චීනය විසින් ප්‍රදර්ශනය කරනු ලැබීය. සත්‍ය ලෙසම එය ඇමරිකාව ප්‍රමුඛ කොට ගත් ලෝක බලවතුන්ට විශාල අභියෝගයක් වන තරමටම ජනමාධ්‍ය මඟින් විකාශය කළේය. එයින් චීනය යුධ බලය අතින් කෙතරම් බලවත්ද යන වග අපට පෙන්විය. යුධ හමුදා ශක්තිය අතින් සේම නවීන තාක්ෂණික අවි ආයුධ අතින් ද ඔවුන් අංක එක හෝ ඊට ආසන්නව සිටී. එදා එම සැමරීමට සහභාගි වූ රුසියානු ජනාධිපති සහ උතුරු කොරියානු උත්තරීතර නායකයා චීන රජයේ ජනාධිපති සමඟ කොමියුනිස්ට් මහා ලේකම්වරයා එක් ස්ථානයකට රැස් වී සිටීම සියලු දෙනාගේ අවධානයට පාත්‍ර විය. න්‍යෂ්ටික බලවතුන් වන ඔවුන් එකම එක වේදිකාවක සිට සුහපතා ගැනීම ලෝකයේ යුධ සමතුලිතතාවය නිශ්චිතවම දැන් නැනෙහිර දෙසට බර වීමට පටන් ගත්බවට වූ මෙය ඉතා සුවිශේෂී සිදුවීමකි.

වර්තමානයේ මෙම චීනය නැමති රට ශුද්ධ වූ බයිබලයේ පිළිබිඹු කර ඇත්තේ කෙසේද? යන්න අධ්‍යනය කරමු. චීනය යන නම ශුද්ධ වූ බයිබලයේ සඳහන් නොවේ. නුමුත් **එළිදරව් 9:12-21** දක්වා ලෝකයේ නැගෙනහිර දෙසින් එන මහා යුධ සේනාවක් ගැන පැහැදිලිව සඳහන් වේ.

එලෙසම මෙහි එනුන් ගංගාව ලෙස සඳහන් වී ඇත. ඊශ්‍රායෙල් රටට නැගෙනහිරින් තිබෙන එනුන් ගංගාව, ඊශ්‍රායෙල් රටේ දේශසීමාව ලෙසත් බයිබලයෙහි සඳහන් වේ. **"එප්‍රාත් ගංගාව ලඟ සිටින්නා වූ නැගෙනහිර දේවදූතයන් මුදා හරියි ".** එනම් අසරු සේනාවක්/හමුදා සේනාංකයක් පැමිණෙන බව එයින් සඳහන් වේ. මෙහි සුවිශේෂී දේ නම් නැගෙනහිර පමණක් නොව ඊශ්‍රායෙල් සිට නැගෙනහිර දෙසට ඉරක් ඇඳින විට අපි චීනය වෙතට ළඟා වෙමු. අපගේ සුවිශේෂී ලෝක සිතියමේ නම් මෙම හමුදාවේ සංඛ්‍යාවද බයිබලයේ සඳහන් වීම බයිබලයේ

සත්‍යතාවය විද්‍යාමාන වන සාධකයකි. මෙම අනාගත වාක්‍ය ලිව්වා වූ යොහාන් තුමා ජීවත් ව සිටි පළමුවන ශතවර්ෂයේ දී ............ හමුදාවක් යනු සිහිනයක් බඳු දෙයකි. නුමුත් දෙවියන්වහන්සේ විසින් ඔහුට පෙන් වූ දේ ඔහු නිවැරදි ලෙසම ලිවීය. මිලියන 200ක හමුදා බලයක් ඒකරාශී කළ හැක්කේ කුමන රටට ද? දැනට මුළු ලෝකයටම ඇත්තේ එවැනි එකම රාජ්‍යයකි. එනම් චීනයයි. ලෝකයේ වැඩිම ජනගහනයක් ජීවත් වන එනම් කෝටි 150 ක් පමණ ජීවත් වන රටක් වන ඔවුන්ට මිලියන 200ක හමුදාවක් ගොඩ නැගීමට හැකියාව ඇත. දැනටත් ඔවුන්ට නිතිපතා සේවයේ යෙදෙන මිලියන 2ක යුධ හමුදාවක් සිටී. නුමුත් අනෙකුත් හමුදාවන් (නාවික/ගුවන්) සහ ස්වේච්ඡා කණ්ඩායමේ සියල්ල එකතු කළ විට මිලියන 200 අපහසු දෙයක් නොවේ. ඉතින් මෙම හේතූන් මත චීනය යන නම බයිබලයේ සඳහන් නොවුනත් චීනය ගැන මේ බයිබලයේ ප්‍රකාශ වේ. බයිබලයෙහි තවත් රටවල් වල නම් සහිතව සඳහන් වන නුමුදු සමහර රටවල් පිළිබඳ නමක් නොමැතිව, නුමුත් හඳුනාගත හැකි සාක්ෂි සහිතව සඳහන් වේ. තවත් ඉදිරියට යමින් ඔබට **එළිදරව් 16:12-14** කියවීමට උනන්දු කිරීමට මම කැමතියි. මෙහි සඳහන් ආකාරයට මහා බලවේගයක් පැමිණීමට නියමිතය. මෙහි සර්පයා ලෙස හඳුන්වන්නේ පුරාණ සර්පයා වන යක්ෂයාය.

ඔහුගේ තදබල දැඩි ක්‍රියාවකින් මුළු ලෝකයේ රජවරුන් යුද්ධයට පිවිසෙයි. අවසාන



කාලයේදී ලෝක යුද්ධයක් පැමිණීමට නියමිතය. මෙහි **16:12 වන පදයේ "ඒ ...... දූතයා තමාගේ පාත්‍රය එප්‍රාන් ගංගාවේ වගුරවයි. එවිට නැගෙනහිර දෙසින් රජුන්ගේ මාවත විවර වේ."** එනම් එම ගංගාව සිඳීයයි. එනම් නැගෙනහිර දිසාවේ රජවරු එනම් චීනය ප්‍රමුඛ අනෙකුත් රටවල් යුද්ධමය අතින් ඉතා ශක්තිමත්ය. ඉන්දියාව, ජපානය රටවල් වල ඒකත්වයත් ඇතිව ප්‍රධාන ලෙසම ඒ චීනය වේ. මේ ලෝකයේ පසුබිම දේශපාලනමය සහ යුධමය පසුබිම මෙම කාරණා සිදුවීමට මනාව සැකසී ඇති බව විද්‍යාමාන වේ. චීනය රටක් ලෙස දෙවියන්වහන්සේ පිළිබඳ විශ්වාසයක් නැති, ප්‍රසිද්ධියේම දෙවිකෙනෙකු අනුමත නොකරන්නා වූ රටකි. නුමුත් ඒ තත්වය මත පවා යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අදහන්නා වූ විශාල ජනතාවක් සිටින බව අප දන්නා කරුණකි. සමහර අය රහසිගත ලෙසත් සමහර අය ප්‍රසිද්ධියේත් දෙවියන්වහන්සේට ඔවුන්ගේ නමස්කාරය සිදු කරනු ලබයි. කෙසේවෙතත් රටක් ලෙස ගත් කළ, රාජ්‍යයක් ලෙස ගත් කල ඔවුන් දෙවියන්වහන්සේව ප්‍රතික්ෂේප කරයි. එලෙසම බහු දෙවිවරුන් අදහන ඉන්දියාව වැනි රාජ්‍යයන් සහ දේවවාදය අනුමත නොකරන ජපානය වැනි

රටක් ද මොවුන් ඒකරාශී වී නැගෙනහිරින් පැමිණෙන රජවරුන් ලෙස සැලකිය හැකිය. තවත් ඉදිරියට යමින්, **දානියෙල් 11:44** හි ඔහු සඳහා ලෝකයට බිහිවීමට යන ලෝක නායකයායි. ඔහුට බයිබලයේ මෘගයා ලෙසද ආමන්ත්‍රණය කරයි. තනි නායකයෙක් ලෙස මුළු ලෝකයටම බලය පැතිරවීමට සැරසෙයි. නුමුත් නැගෙනහිර දිසාවෙන් එන්නා වූ තොරතුරු වලට ඔහු කැළඹෙන බව ඉහත පදයේ සඳහන් වේ. එනම් ඔහුගේ ආධිපත්‍ය සදාකාලයටම නොපවතින බව අදහස් කෙරේ. ඔහුට එරෙහිව අවසන් දවස් වල නැගෙනහිරින් පැමිණෙන්නා වූ ආරංචි යහපත් නොවන බව සඳහන් වේ. මේ නිසා චීනය යන නම කෙලින්ම ශුද්ධ බයිබලයේ සඳහන් නොවූවත් නැගෙනහිර දෙසින් කෝටි 20ක හමුදාවක් පැමිණෙන බව සඳහන් වන නිසා දෙවියන්වහන්සේ චීනය දෙසට තම ඇඟිල්ල දිගු කරන බව අප බොහෝ දෙනා තේරුම් ගෙන ඇති කරුණකි. මෙය අනාගතයට සිදුවීමට යන කරුණකි. වසර 2000 ක පටන් මනුෂ්‍යයන් බයිබලය තුළින් මෙම සිදුවීම් කියවනු ලබයි. නුමුත් මෙතෙක් මෙවැනි සිදුවීමක් සිදු වී නැත. එය සිදුවීමට ආසන්න බව නම් පෙනෙන්නට ඇති කරුණකි. මෑතකදී සැප්තැම්බර් 3 මහා යුධ පෙළපාලිය පවත්වන විට එම ජනාධිපතිවරුන් ඉතාමත් ආඩම්බරයෙන් ඔවුන් එය ප්‍රදර්ශනය කළා. මේ තුළින් අපට පෙනෙන්නේ දෙවියන්වහන්සේගේ වචනයේ සඳහන්ව තිබෙන තොරතුරු සිදුවීමට නියමිත බවයි. ඉතින් මේ නිසා ශුද්ධ වූ බයිබලය කියවීම ඔබ දැන් ආරම්භ කළ යුතුය. ඉතා බරපතළ ලෙස ඔබගේ ජීවිතයේ වෙනසක් සිදු විය යුතුය. දෙවියන්වහන්සේව දැන හඳුනා ගත යුතුය. ඒ සඳහා ඇති එකම මාර්ගය ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සහ උන්වහන්සේ කරන ලද ක්‍රියාව විශ්වාස කරන්න, එනම් ඔබගෙත් මගෙත් පාපවල මිලය ගෙවා නිම කරන පිණිස යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කුරුසියක් මත මරණයට පත්වීමය. වලළනු ලැබ, තුන්වෙනිදා නැවත නැගිටිනු ලැබීමයි. අදටත් උන්වහන්සේ ඔබගේ හදවත තුළට පැමිණ ඔබගේ ජීවිතය සම්පූර්ණයෙන්ම නිවැරදි මාර්ගයට හැරවීමට උන්වහන්සේ සූදානම් ව සිටී. ඔබ උන්වහන්සේව ඔබගේ හදවතට පිළිගැනීමට සූදානම් ද?

*"නුමුත් යම් පමණ දෙනෙක් උන්වහන්සේ පිළිග ත්තෝද, ඔනම් උන්වහන්සේගේ නාමය කෙරෙහි අදහාගත්තෝද, ඔවුන්ට දෙවියන්වහන්සේගේ දරුවන් වෙන්ට උන්වහන්සේ බලය දුන් සේක" (යොහාන් 1:12).*

- නෙවිල් ජයසුන්දර සහෝදරයාගේ දේශනාවක් ඇසුරින් සකස් කළේ -

**- අමන්දි -**

# රූත්



රූත්ගේ කතාව, සිත් ඇදගන්නා සුළු කෙටි කතාවක ස්වරූපයෙන් සැබෑ කතා පුවතක් ගෙනහැර පායි. පද අසූ පහකින් සමන්විත වූ මෙම පොත එක පැයකින් කියවා නිම කළ හැකිය. එම පොතේ කතා නායිකාව වන රූත් නම් කැපී පෙනෙන චරිතය තුළින් අපට ඉගෙන ගත හැකි පාඩම් කිහිපයක් ඔබට හුවා දැක්වීම මෙම ලිපියේ බලාපොරොත්තුවයි.

## දෙවියන්වහන්සේ පරමාධිපත්‍යයයි.

රූත් මෝවබිය තරුණියක් බව පළමු පරිච්ඡේදයේ 4වන පදයෙන් පෙනේ. ඇය ජීවත් වූ මෙම මෝවබ් නම් වූ දේශය පිළිබඳව යමක් දැනගැනීම වැදගත් වේ. මන්ද එවැනි දේශයක ජීවත් වූ තරුණියකගේ කතාව ඉතාමත් සුන්දර ආකාරයට අවසන් වීම පුදුම සහගතයි.

මෝවබ්වරු ගැන සලකා බැලීමේදී ඔවුන් ගැන කිසිඳු හොඳක් දේවවචනයේ සඳහන් නොවේ. ඔවුන්ගේ පටන්ගැන්ම ආබ්‍රහම්ගේ ඥාති පුත්‍රයෙකු වූ ලොත්ගෙන් පැවත එන්නෙකැයි පෙනෙන නමුත්, එම පටන්ගැන්ම දේවවචනය හා ලෝක සදාචාරයට පටහැනි සම්බන්ධතාවයකින් ආරම්භ වූවකි. (**උත්පත්ති 19:30-37 කියවන්න**) දූෂිත ලෙස ආරම්භ වූ එම ජාතිය දූෂිත කමටම කැපව සිටි මිනිස් කොට්ඨාසයකි. ඔවුන්ගේ නමස්කාර පිළිවෙල ඉතාමත් අසභ්‍ය සහ අසික්කිත දේවලින්ද, වෛශ්‍යාවන්ගෙන්ද පිරී තිබුණු බව **ගණන් කථාව 25:1-5** දක්වා සඳහන්ව තිබේ. ඔවුන් තමන් ගේ කාරණා ඉෂ්ඨ කරගැනීමට තම දෙවිවරුන්ට මිනිස් බිලි පූජා ද පැවැත්වූ ආකාරය **2 රාජාවලිය 3:26,27** පද වල සඳහන්ය. "**මෝවබ්වරුන්ගේ පිළිකුල**" ගැන **1 රාජාවලිය 11:7 සහ 2 රාජාවලිය 23:13** යන පද කියවා දැන ගත හැක. මෙවැනි දූෂිත පිළිකුල් සෙනඟකට දෙවියන්වහන්සේගේ සභාවට කිසිසේත්ම ඇතුල්විය නොහැකියැයි උන්වහන්සේම අණකළ සේක. **"අම්මෝනියෙක්වත්, මෝවබියෙක්වත් ස්වාමින්වහන්සේගේ සභාවට ඇතුල් නොවිය යුතුය, ඔවුන්ගෙන් පැවත එන කිසිවෙක් දසවෙනි පරම්පරාව දක්වාත්, කවදාවත් ස්වාමීන්වහන්සේගේ සභාවට ඇතුල්නොවිය යුතුය" ද්විතිය 23:3** තත්වය මෙසේ තිබියදී රූත් නම් මෙම මෝවබීය තරුණිය දෙවියන්වහන්සේගේ ජාතිය වන ඊශ්‍රායෙල්වරුන්ට උරුමකම් කීවා පමණක් නොව දාවිත් රජුගේ මිත්තණිය හා ස්වාමී වූ යේසුස්වහන්සේගේ පෙළපතටත් තම නාමය ඇතුල්කර ගැනීමට සමත් වූවාය. ඇයගේ කතාව මෙලෙස අලංකාර කිරීමට, සියලු දේවලට ඉහළින් සිට සෑම දේ පාලනය කළේ එකම ජීවමාන දෙවියන්වහන්සේයි. උන්වහන්සේට ඕනෑම දෙයක්, ඕනෑම ආකාරයකට, ඕනෑම වෙලාවක කළ හැක. උන්වහන්සේ පරමාධිපත්‍යයි.

පළමු පරිච්ඡේදයේ පළමු පදයේ සඳහන් සාගතය දෙවියන්වහන්සේම සිදුවන්නට සැලැස්වූ දෙයකි. මක්නිසාද ඊශ්‍රායෙල් සෙනඟ දෙවියන්වහන්සේට අකීකරු වී ඔවුන්ගේ මාර්ගවල ගියොත්, ඔවුන්ගේ වැරදි ගැන පසුතැවිලි නොවුනොත් සාගත හා වසංගත වලින් දඬුවම් කරන බවට බයිබලයේ මීට පෙර තිබෙන පොත් වල අනතුරු අඟවා තිබූ සේක. එලිමෙලෙක් ජීවත් වූ කාලවකවාණුවත් එවැනි අවස්ථාවකි. එම නිසා එලීමෙලෙක් සහ නයෝමි පුතුන් දෙදෙනාද කැටුව මෙම සාගතයෙන් බේරෙන්නට, බෙත්ලෙහෙම

අතහැර මෝවබ් දේශයට යාමට තීරණය කිරීම හොඳ තීරණයක් නොවේ. ඔවුන්ට යහපතක් වේ යැයි බලාපොරොත්තුව එම දේශයට ගිය නමුත්, සිදු වූයේ අයහපත පමණක්ම බව පළමුවෙනි පරිච්ඡේදය කියවා දැනගත හැක. ඔවුන් එහි ගිය පසු පළමුවෙන්ම එලිමෙලෙක්ද, දස වසරකට පසු පුතුන් දෙදෙනා වන මාලොන් සහ කිලියොන්ද මරණයට පත් වූවෝය. එම දස වසර ඇතුළතදී මාලොන් සහ කිලියොන්ද දෙවියන්වහන්සේගේ වචනයට විරුද්ධව වැරදි තීරණ ගෙන මෝවබිය තරුණියන් දෙදෙනෙකු විවාහ කරගැනීමෙන් පසු වැඩිකල් ජීවත් වීමට ඔවුන්ට නොහැකි විය. මේ හේතුවෙන් නයෝමි, රූත්, ඕර්පා යන ස්ත්‍රීන් තිදෙනාම වැන්දඹුවන් ලෙස ඉතිරි වූහ. වැන්දඹුවන් තිදෙනෙකුගේ කණගාටුදායක තත්වය ඔබට විස්තර කිරීමට අවශ්‍ය නැත. එවැනි අවාසනාවන්ත, දුක්ඛිත තත්ත්වයක් තිබුණත් දෙවියන්වහන්සේගේ පරමාධිපත්‍යය ඒ සිදුවීම් සියල්ල අභිබවා ක්‍රියාත්මක විය. මේ වන විට බෙත්ලෙහෙමේ සාගතය නිමා වී තිබුණු බව නයෝමි දැනගෙන, තම ලේලීන් දෙදෙනා වන රූත් සහ ඕර්පා සමඟ ආපසු බෙත්ලෙහෙමට යන්නට ගමන පටන් ගත් නමුත්, ලේලීන් දෙදෙනාටම ඔවුන්ගේ මව්වරුන් ළඟට ආපසු හැරී යන ලෙස නයෝමි ඉල්ලා ඔවුන් දෙදෙනා සිඹ සමුදුන්නාය. දෙදෙනාම තරයේ ඊට විරුද්ධව සිටියද අවසානයේ ඕර්පා පමණක් හැරී ගියාය. රූත් තම නැන්දණියට බෙහෙවින් ඇලුම්ව සිටි නිසා ආපසු හැරී නොයාමට තීරණය කළාය. ඇය පැවසූ වදන් ඉතාමත් ආදරණීයයි. **"ඔබ අත්හැර යන ලෙස මට පෙරැත්ත නොකරන්න. ඔබ යන තැනට මමත් යමි. ඔබ නවතින තැන මමත් නවතිමි. ඔබේ සෙනඟ මගේ සෙනඟ වන්නෝය. ඔබේ දෙවියන්වහන්සේ මගේ දෙවියන්වහන්සේවනසේක." රූත් 1:16.** මෙහිදී



අපට නයෝමි වන නැන්දම්මාගෙන්ද වැදගත් කරුණක් ඉගෙනගත හැක. "නැන්දම්මා - ලේලී" අතර පවතින විරසකය සෑම කාලයටම පවතින එකක් නමුත්, නයෝමි සහ රූත් අතර තිබුණේ ඉතාමත් ලෙන්ගතු සම්බන්ධතාවයකි. රූත් තම නැන්දණියට දැක්වූ ප්‍රේමණීය යටහත්කම එම මොහොතේ පමණක් නොව ඉදිරියටත් එලෙසම පැවති බව මෙම පොත කියවන ඔබට දැනගත හැකිය. ඊට හේතු සාධකය වන්නේ නයෝමිගේ සාක්ෂියයි. මන්ද ඇගේ ස්වාමිපුරුෂයා මරණයට පත් වූ විටත්, තම පුතුන් දෙදෙනා මරණයට පත් වූ විටත් ඇය දෙවියන්වහන්සේට දොස් තැබුවා නම්, උන්වහන්සේ කෙරෙහි සිත් අමනාපකමක් තබාගෙන ක්‍රියා කළා නම් රූත් කිසිවිටෙකත් **"ඔබේ දෙවියන්වහන්සේ මගේ දෙවියන්වහන්සේ"** යැයි නොකියන්නීය. මේ තුළින් අප දකින්නේ නයෝමි - රූත් යන මේ දෙදෙනාම එක්ව අන්‍යෝන්‍ය සම්බන්ධතාවයක් හා අන්‍යෝන්‍ය ඇදහිල්ලක් ඇතුව එකඟව සිටි බවයි. දෙදෙනාම එක්ව යුදා හී බෙත්ලෙහෙමට පැමිණියෝය. රූත් ගත්තා වූ එම තීරණය ඇගේ ජීවිතයේ මහත් විපර්යාසයක් ඇති කරන්නට මඟ පෑදීය. **ද්විතීය කථාව 23:3** පදයට අනුව කවදාවත් ඊශ්‍රායෙල්වරුන් සමඟ සම්බන්ධ වීමට නොහැකිව සිටි මෙම අන්‍යජාතික තරුණියට **"පරමාධිපත්‍ය දෙවියන්වහන්සේ"** එම මහඟු අවස්ථාව ලබාදුන් සේක.

## <u>දෙවියන්වහන්සේගේ අනුග්‍රහය.</u>

ඇගේ ජීවිතයේ ඉදිරි අනාගතය සඳහා දෙවියන්වහන්සේ සෑම සැලසුමක්ම සාදා දුන් සේක. මෝවබ් නම් දූෂිත දේශයෙන් ගැළවී ඊශ්‍රායෙල් රටට එන්නටත්, ඉන් ඉදිරියට සිදුවීමට නියමිතව තිබූ සියලු දේත් දෙවියන්වහන්සේගේ අනුග්‍රහය කරණකොට ගෙන පමණක්ම වූ බව අපට දැක ගත හැකිය. බෙත්ලෙහෙමට පැමිණි ඔවුන් දෙදෙනාගේම ජීවිකාව සඳහා රූත්ට කරල් ඇහිඳින්න යන්නට සිදුවිය **(රූත් 2:2,3).** රූත් ඇයට කරුණාව පෙන්වන කෙනෙකු පස්සේ යමින් කරල් ඇහිඳින්නට ගියාය. එසේ ගියේ බෝවස් නම් ධනවත් මනුෂ්‍යයකුගේ කෙතටයි. එම ස්ථානය ඇය සොයා ගියා

නොව, එම ස්ථානයට ඇයව යවනු ලැබුවේ දෙවියන්වහන්සේ විසින්මය. නැවතත් **ද්විතීය කථාව 23:3** පදය දෙසට යොමු වුණොත් එහි සඳහන් දෙවියන්වහන්සේගේ විනිශ්චයේ වචන මතක් කරගත හැකිය. නමුත් ඒ මහත් විනිශ්චයට ඉහළින් මේ දුප්පත් කාලකණ්ණි වැන්දඹුවට දෙවියන්වහන්සේ ගේ අනුග්‍රහය භුක්ති විඳීමේ වරප්‍රසාදය අත් විය. රූත් බෝවස්ගේ කෙතේ කරල් ඇහින්දාය.

## <u>මිදුම්කරුවා</u>

බෝවස් නයෝමිගේ ළඟම නෑයෙක් බව පසුව රූත්ට හෙළිදරව් කරනු ලැබීය. මෙලෙස දෙවියන්වහන්සේම රූත්ට එම ළඟම නෑයා වන "මිදුම්කරුවා" සොයා දුන්සේක. මක්නිසාද එලිමෙලෙක් සහ ඔහුගේ පුත්‍රයින් දෙදෙනාටම උරුම බිම් කොටස මුදවා ගැනීමේ අයිතිය තිබුණේ බෝවස්ටයි. ඔහු රූත්ට ඉතා කරුණාවෙන් කතාකරමින් තමාගේ කැමැත්තෙන් එම උරුමය මුදවා ගැනීමට ඉදිරිපත් විය. ඊශ්‍රායෙල් රටේ හොඳ තරුණියන් බොහෝමයක් එදා සිටින්නට ඇත. නමුත් බෝවස් තෝරා ගත්තේ ඊශ්‍රායෙල් වරුන් විසින් කොන්කරන ලද අන්‍යජාතික ස්ත්‍රියක් වීම සුවිශේෂී සිදුවීමකි. ඔහු ඇයව තෝරාගත්තා පමණක් නොව ඇය ගැන ඉතාමත් අලංකාර සාක්ෂියක් හා පොරොන්දුවක් සමඟ ආශිර්වාදයක්ද ප්‍රාර්ථනා කළේය. **"මාගේ දියණියනි, ස්වාමීන්වහන්සේගෙන් නුඹට ආශිර්වාද ලැබේවා, නුඹ දිළිඳු හෝ පොහොසත් හෝ තරුණයන් පස්සේ නොගිය කාරණයෙන් නුඹ පටන්ගැන්මට වඩා අන්තිමේදී වැඩි කරුණාව පෙන්වූයෙහිය, දැන් මාගේ දියණියෙනි භය නොවන්න, නුඹ කියන සියල්ල නුඹට ඉෂ්ට කරන්නෙමි, මක්නිසාද මාගේ සියලු මනුෂ්‍යයෝ නුඹ සුශීලවත් ස්ත්‍රියක් බව දනිති " රූත්ගේ කථාව 3:10,11.** අවසානයේදී රූත් බෝවස් නම් ධනවත් මනුෂ්‍යයාගේ ආදරණීය බිරිඳ වීමේ භාග්‍යය ලැබුවාය **(රූත් 4:12).** එසේම පුත්‍රයෙකු ලැබීමේ ආශිර්වාදය ද ස්වාමින්වහන්සේ ලබාදුන් සේක. **(රූත්ගේ කථාව 4:13)** එමඟින් දාවිත් රජුගේ මිත්තණිය බවට පත්වීමෙන්, යේසුස්වහන්සේගේ පරම්පරාවට ඇතුල්වීමේ වරප්‍රසාදයද ලැබුවාය. **(රූත්ගේ කථාව 4:16,17 සහ මතෙව් 1:5,6 පද)** කියවන්න.

## <u>පූර්ව ඡායාව</u>

මෙම කතාව අපගේ කතාවයි. අපගේ ජීවිතය ගැන දෙවියන්වහන්සේට අගනා සැලැස්මක් තිබේ. සියල්ල වෙන්ට සලස්වන්නේ පරමාධිපත්‍ය දෙවියන්වහන්සේයි. අපිත් රූත් මෙන් ජීවමාන දෙවියන්වහන්සේ මාගේ දෙවියන්වහන්සේ යැයි මුළු සිතින් විශ්වාස කළොත්, අපගේ ජීවිතයේ බලාපොරොත්තු සුන්වීම් උන්වහන්සේ යහපතට හරවන සේක. අද අපගේ ළඟම නෑයා යේසුස් ක්‍රිස්තුස්වහන්සේයි. උන්වහන්සේ අපව මුදන, ගළවන තැනැන්වහන්සේය. දෙවියන්වහන්සේ රූත්ට කළාක් මෙන් අපටත් ප්‍රීතිමත් අවසානයක් ස්වර්ගීය උරුමයක් සූදානම් කර තිබෙන සේක.



මෙම කතාව තුළ දෙවියන්වහන්සේගේ අනාගත සැලසුම ගැන පූර්ව ඡායාවක් ගැබ් වී ඇත. බෝවස් තුලින් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ද, රූත් තුළින් ක්‍රිස්තුස්වහන්සේගේ මනාලිය වන අන්‍යජාතික සභාවද, පිළිබිඹු කරයි. බෝවස් රූත්ගේ මිදීම සිදු කළ "ළඟම නෑයා" වූ ආකාරයට යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සභාවේ මිදුම්කරුවාණන් බවට පත් වූ සේක. සුශීලවත් ස්ත්‍රියක් ලෙස බෝවස්ගෙන් යහපත් සාක්ෂිය ලැබූ රූත් ලෙස වර්තමාන කිතුණු සභාවත් යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රසාදය ලැබෙන හැටියට අවංක ඇදහිල්ලත්, භක්තියත් ඇතුව ජීවත් විය යුතුය.

**- ඈන් ජයසුන්දර -**

# කුණාටු - සැඩ සුළං, තද වැසි සහ අකුණු වලින් සමන්විතයි.

**කුණාටුවකින් ඇති විය හැකි බලපෑම් මොනවාද?**

**අවාසි**

- අකුණු ගින්නෙන් සතුන් හා මිනිසුන් මියයෑම.

- කුණාටු ජලයෙන් වගාවන්, පශු සම්පත් මෙන්ම වාස භූමි විනාශ වීම.

- ගොඩනැගිලි, පාලම් හා පාරවල් මෙන්ම විදුලි රැහැන්, විදුලි සංදේශ රැහැන් විනාශ වීම.

- පානීය ජලය හා ආහාර හිඟවීම.

ඉහත කී දේ සලකා බලන විට සොබාදහමේ කුණාටු නොතිබුණෝ නම් මේ ලෝකය මීට වඩා හොඳ තැනක් වේවිද?

**වාසි**

- කුණාටු වල ධනාත්මක ප්‍රතිඵල: සොබාදහම් පරිසරයේ සමතුලිතතාවය රැක ගැනීම.

- අකුණු වල ධනාත්මක ප්‍රතිඵල( Oxygen ($O_2$) වලින් Ozone ස්ථරය ($O_3$) නිපදවීම. ආරක්ෂක Ozone ස්ථරය නොවන්නට, සූර්යයාගේ හානිකර විකිරණ (පාරිජම්බුල කිරණ) හේතුවෙන්, මිහිපිට කිසිදු ජීවයක් පැවතිය නොහැකිය.

- එමෙන්ම නයිට්‍රජන් වලින් ශාක වර්ධනයට අවශ්‍ය නයිට්‍රේට් නිපදවන්නේද, අකුණක සැර ක්‍රියාව තුළිනි. තවද වැසි වනාන්තර තුළ අකුණු සැර වැදී හටගන්නා ගින්න, අලුත් පැළෑටි බිහිවීමට හේතු වේ. ඝන රළු ආවරණයකින් ආරක්ෂිත ඇතැම් ශාක බීජ රෝපණය විය හැක්කේ ගින්නෙන් රත් වී පුපුරා එම ආවරණය ඉවත් වූවොත් පමණි.

**ඇදහිලිවන්තයෙකුගේ ජීවිතයේ ඇතිවන කුණාටු (පීඩා) ඔහුට ධනාත්මක බලපෑමක් ඇති කළ යුතුය.**

කුණාටු නොහොත් පීඩා ලෙස ගත හැකි දේ මොනවාද?

වියෝව, බරපතළ අසනීප තත්ත්වය, රැකියා අහිමි වීම, දේපළ අරමුදල් අහිමි වීම, මිතුරන් පවුලේ අය සගයන් විසින් විශ්වාසය පාවා දීම, වරදවා වටහා ගැනීම ආදිය.

**කුණාටුව එවන්නේ කවුද?**

**සතුරා වන සාතන්** - විනාශයේ කුණාටු (දෙවියන්වහන්සේ අවසරය ඇතිව).

- **යෝබ් 30:22** ඔබ සුළඟට මා ඔසවා දී එයින් මා ගසා ගෙන යන්නට සැලසූ සේක්, කුණාටුවෙන් මා එහා මෙහා පෙරළා දැමූ සේක, (යෝබ්ගේ වරද වැටහීම).

- **යෙසායා 25:4** දුගියාට ඔබ රක්ෂ ස්ථානයක් ව සිටි සේක්, දිළින්දාට ඔහුගේ

විපතේදී ඔබ ඔහුට රක්ෂා ස්ථානයක් වූයේ කුණාටුවේදී ආවරණයක් ද ගිනියම් වෙලෙහි සෙවණක් ද වෙමිනි. මන්ද කුරිරු මිනිසුන්ගේ හුස්ම, තාප්පයකට ගැසූ කුණාටුවක් සේද,

● **ගීතාවලිය 57:1** මට දයා වුව මැනව, අහෝ දෙවියන්වහන්ස, මට දයා වුව මැනව, මන්ද ඔබවහන්සේ තුළ මම සරණය ලබමි, මේ විපත්තිදායක කුණාටු පහව යන තෙක්, ඔබගේ පියාපත් සෙවණේ මම සරණ සොයන්නෙමි.

## දෙවියන්වහන්සේ

● **යෝබ් 38:25-27** ධාරානිපාත වර්ෂාවට වැහි- මාර්ග කපන්නෙත්, විදුලි අකුණුවලට මාවතක් තැනුවේත් කවුරුන්ද? එසේ කර ඇත්තේ, කිසිවෙකුත් වෙසෙන්නේ නැති පෙදෙසක් වූ, කිසි මිනිසෙකු නැති කාන්තාරයට ජලය සපයන්නටත්, පාළු නිසරු දේශය සනහාලමින් එහි තෘණ හට ගන්වන්නටත්ය.

● **සෙකරියා 10:1** වසන්ත කාල වර්ෂා සෘතුවේ, ස්වාමින්වහන්සේගෙන් වර්ෂාව ඉල්ලන්න. කුණාටුවේ වලාකුළු තනන්නේ ස්වාමින්වහන්සේය. උන්වහන්සේ මහ වර්ෂා එවීමෙන් කෙත් වතුවලින් හැමටම ගස්වැල් ලබාදෙන සේක.

● **ගීතාවලිය 107:25** මන්ද උන්වහන්සේ අණ කරමින්, චණ්ඩ මාරුතය කැළඹූ කල, රළ රැළි ඉහළ පැන නැංගේය.

## කුණාටු වර්ග හතරක්

1. **නිවැරදි කිරීමේ කුණාටු :** උදා. යෝනා - අවශ්‍ය විටෙක නව ආරම්භයක් ලබා දීමට.

2. **සම්බන්ධතා ඇතිකරන කුණාටු; (යෝසප්ගේ ජීවිතයේ):** ඔහුට තම පියා වන යාකොබ් සහ දෙවියන්වහන්සේ සමඟ විශේෂ සම්බන්ධතාවයක් තිබුණි.

● ඔහු තම සහෝදරයන් ගැන නරක වාර්තාවක් ගෙන ආ විට

● ඔහු තම සිහින දෙක ගැන ඔවුන්ට පැවසූ විට

● පෝතිපර්ගේ බිරිඳ ඔහුට බොරු චෝදනා කළ විට

● දෙවියන්වහන්සේ සමඟ අපගේ සම්බන්ධතාවය නිසා වෙනස්කම් කරනු ලැබීම

3. **පරිපූර්ණත්යේ කුණාටු**

● **යෙසායා 48:10** ඔන්න, මම ඔබ පවිත්‍ර කළෙමි. එහෙත් රිදී මෙන් නොවේ. විපත්ති පීඩා උදුනෙහි මම ඔබ සෝදිසි කළෙමි.

● **යෝබ් 36:15** එහෙත් උන්වහන්සේ පීඩා විඳින්නවුන් ඔවුන්ගේ පීඩාවෙන් මුදනා සේක. ඔවුන්ගේ ආපදා අතරින් උන්වහන්සේ ඔවුනට කතා කරන සේක.

● **යාකෝබ් 1:2** මා සහෝදරයිනි, නොයෙක් විදියේ පරීක්ෂාවනට ඔබ මුහුණ පාන කල, ඒවා මහා ප්‍රීතියකැයි සලකන්න.

● **1 පේතෘස් 1:6-7** මේ කාරණයේදී ඔබ බෙහෙවින් ප්‍රීති ප්‍රමෝද වන්නේ, අවශ්‍ය වේ නම්, සුළු කලකට නොයෙකුත් පරීක්ෂාවලින් ඔබ ශෝකයට පත් වූවා වුවද, ගින්නේ ලා පරීක්ෂා කළත් දිරා යන සුළු රත්රන්වලට

වඩා අනර්ඝ වූ පරීක්ෂා කරන ලද ඔබගේ ඇදහිල්ලේ අව්‍යාජත්වය ඔප්පු වී, යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රකාශ වීමේදී එය ප්‍රශංසාවකටද, තේජසකටද ගෞරවයකටද හේතු වන වග දැක්වෙන පිණිසය.

**4. පරාවර්තන කුණාටු**

● **යෙසායා 40:31** එහෙත් ස්වාමින්වහන්සේ තුළ අපේක්ෂාවෙන් බලා සිටින්නෝ, තම ශක්තිය අලුත් කරගන්නෝය. ඔවුහු රාජාලීන් මෙන් පියාසලා, ඉහළ නගින්නෝය. ඔවුහු දුවන නමුදු වෙහෙසට පත් නොවන්නෝය. ඔවුහු ඇවිදින නමුදු ක්ලාන්ත නොවන්නෝය. රාජාලියා කුණාටු වට ඉහළින් ඉහළට නැගී. එය විපත්ති සහ විපත්ති හමුවේ ලෝකයට අපගේ සාක්ෂිය විය යුතුය.

● **ක්‍රියා 27** හි පාවුල්ගේ නැව් අනතුර. පාවුල් කුණාටුවට මුහුණ දුන් ආකාරය ශතාධිපතියා දැක ඇති. දෙවියන්වහන්සේ අපව කැඩපතක් ලෙස භාවිතා කිරීමට කැමතියි. දෙවියන්වහන්සේගේ කරුණාව සහ ඔහුගේ ශක්තිය භාවිතා කිරීමෙන් දෙවියන්වහන්සේ ජීවිත කාලය පුරාම අපට උපකාර කරන ආකාරය අපි අන් අයට පිළිබිඹු කරමු.

● දෙවියන්වහන්සේගේ බලය අපට මතක් කර දීමට - ගලීල මුහුදේ කුණාටුවේ ගෝලයන් - **මාර්ක් 4:39** උන්වහන්සේ නැගිට, සුළඟට තරවටු කොට "නිහඬ වනු, නිසල වනු" යි මුහුදු රැළට කී සේක. එවිට සුළඟ නැවතිණ. සියල්ල නිසල විය.

● අපගේ ආධ්‍යාත්මික කුණාටු වලදී දෙවියන්වහන්සේ එය හොඳින්ම දන්නා බව අපට මතක් කර දීමට.

අ) පාවුල් සහ ඔහුගේ මාංසයේ කටුව. ඔහු දෙවියන්වහන්සේගෙන් එය ඉවත් කරන ලෙස ඉල්ලා සිටියත් දෙවියන්වහන්සේ පැවසුවේ මාගේ කරුණාව ඔබට ප්‍රමාණවත් බවයි. පාවුල් **2 කොරොන්ති 12:10** හි මෙසේ පැවසීය, **"මම දුර්වල වූ විට, මම ශක්තිමත් වෙමි."**

කුණාටුවක් හමුවේ ස්වභාවික ක්ෂණික ප්‍රතික්‍රියාව බිය, භීතිය හෝ කම්පනයයි. එබැවින්, කුණාටුව පැමිණීමට පෙර, එයට වඩා හොඳින් අපට මුහුණ දිය හැකි වන පරිදි සූදානම් වීමේ වැදගත්කම අප වටහා ගත යුතුය. යේසුස්වහන්සේට අවශ්‍ය වන්නේ අප, පර්වතය මත තම නිවස ගොඩනගා ගත් ප්‍රඥාවන්ත මිනිසා මෙන් වීමයි. අපගේ ජීවිතයේ අත්තිවාරම ක්‍රිස්තුස්වහන්සේම වන විට, කුණාටුව පැමිණෙන විට අපි පෙරළී නොයන්නෙමු. කුණාටුව මැද්දේ නැංගුරම් සෙවීම වෙනුවට, කුණාටුව පැමිණි විට අපට ඒවා භාවිතා කළ හැකි වන පරිදි, ඒවා මොනවාද සහ කොහේ තියේද යන්න සොයා ගැනීමද සූදානම් වීම යන්නෙන් අදහස් වේ.

## නැංගුරම් හතක්

**1. දෙවියන්වහන්සේ එය සැලසුම් කර ඇත.**

- **යෙසායා 48:10, යෝබ් 30:22, ගීතාවලිය 107:25** හි අප දුටු පරිදි මෙන්ම **ගීතාවලිය 148:8** හි සඳහන් පරිදි **"උන්වහන්සේගේ අණ ඉටු කරන කුණාටු සුළඟෙනි".**

**2. දෙවියන්වහන්සේ පාලනය කරයි.**

- **ගීතාවලිය 107:29** උන්වහන්සේ කුණාටුව නිශ්චල කළේය, මුහුදේ රළ නිශ්ශබ්ද විය. මෙයට සමාන්තරව, නව ගිවිසුමේ

යේසුස්වහන්සේ පැවසුවේ "අපි අනෙක් පැත්තට යමු" කියායි. ("අපි විල මැදට ගොස් ගිළෙමු" කියා නොවේ). සිටීමට ආරක්ෂිතම ස්ථානය වූයේ යේසුස්වහන්සේ සමඟ අවරේය. නිදා සිටියදී පවා යේසුස්වහන්සේ පාලනය කළේය. **මාර්ක් 4:39** උන්වහන්සේ නැගිට, සුළඟට තරවටු කොට, "නිහඬ වනු, නිසල වනු"යි මුහුදු රැළට කී සේක. එවිට සුළඟ නැවතින. සියල්ල නිසල විය.



**3. දෙවියන්වහන්සේ අප සමඟයි.**

**- යෙසායා 4:6** එය, (දෙවියන්වහන්සේගේ මහිමය) දහවලේ තාපයට සෙවණක් හා මුවාවක් ද කුණාටුවක් හා වැස්සට සුරැකුම් පොළක් හා සැඟවුම් හළක් ද වනු ඇත. **දානියෙල් 3:25,27** එවිට ඔහු, **"අර බලන්න. මිනිසුන් සතරදෙනෙක් බැඳුම් නොමැතිව, ගින්න මැද ඇවිදිනු මට පෙනේ. ඔවුන්ට උපද්‍රවයක් නොමැත. සතරවැන්නා පෙනුමෙන් දෙවියන්ගේ පුත්‍රයකු වගේ."** යි පැවසීය.... දේශාධිපතීහු, ප්‍රදේශාධිපතීහු, ආණ්ඩුකරුවෝ හා රාජකීය උප දේශකයෝද ඔවුන් වට කරගත්තෝය. ඒ තිදෙනාගේ සිරුරුවලට ගින්න කිසි උපද්‍රවයක් කර නැති වග, ඔවුන්ගේ හිස කෙසකුදු දැවී නැතිවග ඔවුහු දුටුවහ. ඔවුන්ගේ සළු වලට ගින්න වැදී තිබුණේ නැත. ඔවුන් ළඟ ගිනි ගඳ තිබුණේද නැත. මේ අවස්ථාවේ **ගීතාවලිය 23 හි** සඳහන් "මරණ සෙවණැලි මිටියාවත" අපගේ මතකයට ආ යුතුය.

**4. දෙවියන්වහන්සේ අපගේ කුණාටුවට වඩා උතුම් ය.**

**- යෙසායා 25:4** දුගියාට ඔබ රක්ෂස්ථානයක් ව සිටි සේක්, දිළින්දාට ඔහුගේ විපතේදී ඔබ ඔහුට රක්ෂස්ථානයක් වූයේ කුණාටුවේදී ආවරණයක් ද, ගිනියම් වේලෙහි සෙවණක් ද වෙමිනි. මන්ද කුරිරු මිනිසුන්ගේ හුස්ම, තාප්පයකට ගැසූ කුණාටුවක් සේද,

**5. දෙවියන්වහන්සේ මා යා යුතු තැනට මා ගෙන යනු ඇත**

**- යොහාන් 6:21** එවිට උන්වහන්සේ ඔරුවට නංවා ගන්නට ඔවුහු කැමති වූහ. එකෙණෙහිම, ඔරුව ඔවුන් යන්නට සිටි ගොඩබිමට සේන්දු විය.

**6. දෙවියන්වහන්සේ ක්‍රියා කරන්නේ සුදුසුම මොහොතේදීය**

- ලාසරුස් මළවුන්ගෙන් උත්ථාන වීම **යොහාන් 11:41-42** එවිට ඔවුහු ගල ඉවත් කළහ. යේසුස්වහන්සේ ඇස් ඔසවා බලා," පියාණෙනි, ඔබවහන්සේ මට සවන් දුන් නිසා මා ඔබට ස්තුති කරනවා. හැම විට ඔබ මට සවන් දෙන වග මා දැන සිටියා. එනමුත් මා මෙසේ කීවේ, මා එවුවේ ඔබවහන්සේ ම වග මෙහි වටේට සිටගෙන සිටින ජනයා විශ්වාස කරන පිණිස ඔවුන් උදෙසා යැ"යි පැවසූ සේක. දෙවියන්වහන්සේ සමඟ පෞද්ගලික සම්බන්ධතාවයක් මත යාච්ඤාව පදනම් කර ගැනීමේ අවශ්‍යතාවය පෙන්නුම් කරයි. යේසුස්වහන්සේ ප්‍රසිද්ධියේ යාච්ඤා කළ සේක. (පෞද්ගලිකව ලාසරුස් නිවස තුළ අසනීපව සිටියදී නොවේ.) සහ ඔහුගේ යාච්ඤාවට පිළිතුර ජනතාව දුටුවේය.

**7. කුණාටුවෙන් පසු ජීවිතයක් ඇත.**

**- යෙසායා 54:10-11** මන්ද කඳු නික්ම යනු ඇත. හෙල් ද ඉවත් කරනු ලබන්නේය. එහෙත් ඔබට ඇති මගේ නොමියෙන පෙම ඔබ වෙතින් නික්ම යන්නේ නැත. මගේ සාමයේ ගිවිසුමද ඉවත් කරනු ලබන්නේ නැතැ"යි ඔබට දයානුකම්පා පානා ස්වාමින්වහන්සේ කියන සේක. අහෝ පීඩාවට පත් කුණාටුවෙන් පහර ලැබූ, සැනසීමක් නොලද නගරය, මෙන්න,නිල් මැණිකෙන් මම ඔබ ගොඩ නගමි. ඉඳුනිලෙන් ඔබේ අත්තිවාරම් දමමි.

(එය නගරයක් හෝ ජනතාවක් හෝ පුද්ගලයෙක් වේවා) රාහබ්ගේ කුණාටුව ගැන සිතන්න. "සිදුවීම්" සැමවිටම " ඇවිත් යනු ඇත", දෙවියන්වහන්සේගේ වචනය කිසි විටෙකත් පහව යන්නේ නැත. කුණාටුව පසු වූ විට, අපට අපගේ තත්ත්වයන්, ආදරණීයයන් සහ ජීවිතයම, කිතුණු සභාවේ ගීතයක සඳහන් කර ඇති පරිදි, "ඉහළින් ඇති අහස මෘදු නිල් පාටයි, අවට පෘථිවිය මිහිරි කොළ පාටයි". ලෙස වඩා හොඳින් අගය කිරීමට හැකිවනු ඇත. එසේම කුණාටුව මැද සිටින අයට අපට වඩා හොඳින් සම්බන්ධ විය හැකි වන අතර ඔවුන්ට ආශිර්වාදයේ මූලාශ්‍රයක් විය හැකිය.

**2 කොරොන්ති 1:4** "අපගේ සියලු දුක් වලදී අපව සනසන්නේ උන්වහන්සේය", එවිට අපව දෙවියන්වහන්සේ විසින් සනසනු ලැබූ පසු ඕනෑම පීඩාවකින් සිටින අයව සනසන්නට අපට හැකි වනු ඇත. කුණාටුවට පවා අපි ස්තූතිවන්ත වන අතර ගීතිකාකරු සමඟ එකඟ වෙමු: **ගීතාවලිය 119:71** ඔබගේ නියෝග ඉගෙනගන්නා පිණිස, පීඩා විඳීම මට හොඳය.

**යාච්ඤාව - ස්වර්ගීය පියාණෙනි, ජීවිතයේ කුණාටු වලදී භාවිතය සඳහා ඔබ සපයා ඇති සියලුම නැංගුරම් සඳහා අපි ඔබට ස්තූතිවන්ත වෙමු. ඔබගේ පොරොන්දු කෙරෙහි විශ්වාසය තැබීමට සහ අපගේ ජීවිතවල ඔබ ඉඩ දෙන කුණාටු වලදී ඔබගේ ප්‍රඥාව සහ බලය, ඔබගේ යහපත්කම සහ අප කෙරෙහි නිමක් නැති දයාව කෙරෙහි අවධානය යොමු කිරීමට ඔබ අපට හැකියාව ලබා දෙන ලෙස අපි ඉල්ලා සිටිමු. කුණාටුව තුළදී ද එය පහව ගිය පසුද අපට ඔබ තුළ රැඳී සිටීමට හැකි වීම ගැන අපි ඔබට ස්තූතිවන්ත වෙමු. ඔබගේ ආදරණීය පුත්‍රයා සහ අපගේ ස්වාමීන් සහ ගැළවුම්කාර යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙන් අපගේ ස්තූතිය පිළිගත මැනව.**


**- ආමෙන් -**



- ඩේවිඩ් ඒතර්ස්ගේ දේශනාවක් ඇසුරෙනි -

**- මාරි පෙරේරා -**

# ජීවිතයේ දුෂ්කරම කාලය තුළ ශක්තිමත්ව වැඩීම.



මෑතකදී, ලෝකයේම ජීවිතවලට වැඩි තර්ජනයක් ගෙන දුන් කොවිඩ් 19 නම් වසංගතය අත් දුටුවේය. මිලියන 2.5 අධික සෙනඟක් ආසාදනයට ලක් වූහ. සිය දහස් ගණනින් මරණයට පත් වූහ. මෙම කාලයේදී වෛද්‍ය වෘත්තියේ පුද්ගලයන්ට ඉතාම අත්‍යාවශ්‍ය වූ දෙයක් නම් පුද්ගල ආරක්ෂිත ආම්පන්නයි.

PPE යයි හඳුන්වනු ලැබූ එයට ආරක්ෂිත ඇඳුම්, හිස් වැසුම්, අත් ආවරණ, මුහුණු ආවරණ, ඇස් කණ්ණාඩි, මුඛ ආවරණ, කෘත්‍රිම ශ්වසනික ආධාර හා තවත් නොයෙකුත් දේ ඇතුළත් විය. එය වෛද්‍ය වෘත්තියේ යෙදී සිටින පුද්ගලයන් විෂබීජ හෝ රෝග වලින් නිරාවරණය වීම වළක්වාලීමට සැලසුම් කර තිබුණි. කොවිඩ් 19 වාතය මඟින් පැතිර යන බැවින් වෛද්‍ය වෘත්තියේ යෙදී සිටින අයට එවැනි ආරක්ෂිත ආම්පන්න වල අවශ්‍යතාවය ඉතාම වැදගත් විය. මෙම තීරණාත්මක කාලය තුළදී සමහර පළාත්වල මෙම ආම්පන්න වල හිඟයක් ඇති විය. වෛද්‍ය සේවයේ යෙදී සිටි බොහෝ දෙනෙක් කොවිඩ් 19 ආසාදනයට ලක් වූහ. වෛද්‍ය සේවයේ යෙදී සිටි මෙකී පුද්ගලයෝ ඉතා කාර්යබහුලව සිටියද ඔවුහු වෛරසයට එරෙහිව ප්‍රතිශක්තිකරණය වී නොසිටියහ. ජීවිතය රැකගන්නට ඔවුනට පුද්ගල ආරක්ෂිත ආම්පන්න අවශ්‍යව තිබුණි.

## තවත් මාරාන්තික වසංගතයක්

අතිභයානක කොරෝනා වෛරසයට වඩා මාරාන්තික වෛරසයකින් යුත් වසංගතයක් ඇත්තේය. පාපයේ වෛරසයෙන් සමස්ත මිනිස් සංහතියම ආසාදනය වී ඇත. අපි එම සටනේ ඉදිරි පේළියේ සිටින්නෙමු. පාපයේ වසංගතය පවතින කාලයේ අපටත් පුද්ගල ආරක්ෂිත ආම්පන්න අවශ්‍යව ඇත. කාර්යබහුලව සිටින බැවින් අප අපගේ පුද්ගල ආරක්ෂිත ආම්පන්නවල අවශ්‍යතාවය අතපසු කර සිටින්නෙමු. අපට පාපයේ වෛරසය ආසාදනය වීමට ඇති බව පෙනෙන්නට ඇත. අතිශය කලබලකාරී ජීවිතයක් ගතකරනවා නම් අපට මාරාන්තික ආත්මික රෝගයක් වැළදීමට ඉඩ තිබුණාද අපගේ ආත්මික ජීවිතයේ වර්ධනය වෙනුවෙන් සැලකිල්ලක් දැක්වීමට කාලය නොගන්නෙමු.

## අපෝස්තුළු පාවුල්ගේ අනුශාසනා

අපෝස්තුළු පාවුල් මෙලෙස ලියන්නේය. " **මක්නිසාද අපගේ පොරබැදීම වනාහී මාංසයට සහ රුධිරයට විරුද්ධව නොව අධිපතිකම් වලටත්, පරාක්‍රමධාරීන්ටත් මේ අන්ධකාරයේ ලෝක මුලාදෑනීන්ටත් ස්වර්ගී ය ස්ථානවල සිටින දුෂ්ඨකමේ ආත්ම සේනාවන්ටත් විරුද්ධවය. එබැවින් නපුරු දවසේදී විරුද්ධව සිටින්නටත් සියල්ල සම්පූර්ණ කරන ස්ථිරව සිටින්ටත් පුළුවන් වෙන පිණිස දෙවියන්වහන්සේගේ සියලු යුද්ධායුධ අරගනිල්ලා" (එපීස 6:12,13).** පාපයේ වෛරසයට එරෙහිව ඇති පුද්ගල ආරක්ෂිත ආම්පන්න දෙවියන්වහන්සේගේ යුද්ධායුධය. ඒවා පරීක්ෂණ කාලය වෙනුවෙන් ඇති උන්වහන්සේගේ ආරක්ෂිත ආම්පන්නයි.

යහපත හා නපුර අතර ඇති මෙම අරගලයේදී දෙවියන්වහන්සේ විසින් අපට

දී ඇති මෙම දිව්‍යමය ආරක්ෂිත ආම්පන්න කුමක්ද? අපෝස්තුළු පාවුල් **2 කොරින්ති 10:4**හි අපට ඉඟියක් ලබාදෙන්නේය. " **මක්නිසාද අපේ යුද්ධායුධ මාංශික නොවේය. එහෙත් ඒවා බලකොටු බිඳ හෙළීමට දෙවියන්වහන්සේ ඉදිරිපිට බලසම්පන්නය".** දෙවියන්වහන්සේගේ මෙම අවි මොනවාද? අප අපගේ පුද්ගලික ජීවිතයේදී ආත්මික අර්බුදයට මුහුණ දීමට සූදානම් වන්නේ කෙසේද? අපගේ ආත්මික ශක්තියේ මූලාශ්‍රය කුමක්ද? පාපයේ වෛරසය සමඟ සටන් කිරීමට දෙවියන්වහන්සේ අපට දී ඇති සම්පත් කුමක්ද? දෙවියන්වහන්සේගේ වචන ජීවමානය. දෙවියන්වහන්සේ තෝරාගත් අවිය උන්වහන්සේගේ වචනයයි. **"දෙවියන්වහන්සේගේ වචනය ජීවමානය. බලවත්ය. කොයිම දෙමුහත් කඩුවකටත් වඩා තියුණුය. ප්‍රාණය හා ආත්මයද සන්ධි හා ඇටමිදුළු ද වෙන් කරන තරමට කාවදින්නේය". (හෙබ්‍රෙව් 4:12)** බයිබලය දෙවියන්වහන්සේගේ ජීවමාන වචනයයි. ශුද්ධාත්මයාණන්ගේ මෙහෙය තුළින් අපගේ හදවත් ප්‍රාණවත් වී අපගේ ජීවිත වෙනස් කරනු ලබන්නේය. අනෙකුත් පොත් අපව ප්‍රබෝධමත් කරනු ලබනවා ඇත. නමුත් දෙවියන්වහන්සේගේ වචනය දේවානුභාවයෙන් දුන් එකකි. අනෙකුත් පොත් මනස ආලෝකමත් කරනවා ඇත. නමුත් දෙවියන්වහන්සේගේ වචනය අපව ආලෝකමත් කරනවා පමණක් නොව එය අපගේ ජීවිත වෙනස් කරන්නේය.

## දෙවියන්වහන්සේගේ වචනය නිර්මාණාත්මක වචනයකි

දේවානුභාවයෙන් දුන් දේව වචනය තුළ ජීවිත වෙනස් කිරීමේ ප්‍රතිපත්ති අඩංගුය. දේව වචනයේ නිර්මාණාත්මක බලය අපගේ අඳුර ආලෝකමත් කරන්නේය. එය අපව වෙනස් කරන්නේය. මැවිල්ලේදී දෙවියන්වහන්සේ කතා කළ විට අපගේ ග්‍රහලෝකය බිහිවිය. උන්වහන්සේ තමන්වහන්සේගේ සර්වබල වචනයෙන් මෙම ලෝකය මැවූ සේක. **ස්වාමීන්වහන්සේගේ වචනයෙන් ආකාශයද උන්වහන්සේගේ මුඛයේ හුස්මෙන් එහි සියලු සේනාව ද මවන ලද්දේය. මක්නිසාද උන්වහන්සේ කථා කල පමණින් ඉෂ්ඨ විය. (ගීතාවලිය 33:6-9)**.

දෙවියන්වහන්සේගේ වචනය නිර්මාණාත්මක වචනයකි. එලෙස උන්වහන්සේ පවසන දේ මීට පෙර කිසිදාක නොතිබුණාද උන්වහන්සේගේ වචනය බලවත් බැවින් උන්වහන්සේ පවසන විට එය නිර්මාණය වනසේක. ඔබටත් මටත් තිබෙන දෙයක් ප්‍රකාශ කළ හැකිය. නමුත් දෙවියන්වහන්සේට නැති දෙයක් ගැන පැවසිය හැකිය. උන්වහන්සේ කතාකරන විට නැති දෙයක් ඇතිවන්නේය. මන්ද උන්වහන්සේගේ වචනය එය එලෙස ඇති කරන සේක. මහලු වියේදී ආබ්‍රහම් හට හා සාරාට දරුවකු ලැබීම ගැන අපෝස්තුළු මෙලෙස පවසන්නේය. නැති දේ ඇති දේ මෙන් සඳහන් කරන්නාවූ දෙවියන්වහන්සේ **(රෝම 4:17)** මීට පෙර කිසිම දවසක ගැබ් නොගෙන සිටි සාරා මහලු වියේදී ගැබ්ගන්නා බව දෙවියන්වහන්සේගේ වචනය ප්‍රකාශ කර තිබුණි. දෙවියන්වහන්සේ ප්‍රකාශ කරන දේ සම්පූර්ණ කිරීමට දෙවියන්වහන්සේගේ වචනයට බලය ඇති බැවින් මෙම දිව්‍ය ප්‍රකාශය සැබෑවක් බවට පත් විය.

මෙන්න ජීවිත වෙනස් කරන පුදුමාකාර සත්‍යයක් පවසා ඇති වචනයේ නිර්මාණාත්මක බලය ලියවිල්ල තුළ ඇත. වචනයේ බලය අඳුරු වූ මනසට ආලෝකය ගෙන දෙන්නේය. වචනයේ බලය පිපාසිත ආත්මය තෘප්තිමත් කර සාගිනි සිත පෝෂණය කරන්නේය. එය ආත්මය නැවත දෙවියන්වහන්සේගේ ස්වරූපයට නිර්මාණය කරන්නේය. එය යහපත හා නපුර අතර ඇති සටනේ දී අප ශක්තිමත් කරන්නේය. වනාන්තරයේ යේසුස්වහන්සේ පරීක්ෂා කරනු ලැබූ අවස්ථාවේදී උන්වහන්සේ මෙම වචන වලින් සාතන්ට මුහුණට මුහුණලා මුහුණ දුන් සේක. **"මනුෂ්‍යයා දෙවියන්වහන්සේගේ මුඛයෙන් නික්මෙන සියලු වචන වලින්**

**ජීවත් වෙනවා මිස රොටි පමණකින් ජීවත් නොවන්නේය." (මතෙව් 4:4)** පුරාණ ලියවිල්ල වන ශුද්ධ වූ බයිබලය අපගේ ආත්ම පෝෂණය කරන්නේය. එහි ඉගැන්වීම් අපගේ ගැඹුරු ආශාවන් තෘප්තිමත් කරන්නේය. පෝෂ්‍යදායක සුවදායක ආහාර මගින් අපගේ ශරීරය පෝෂණය කර ශක්තිමත් කරන්නා සේ දෙවියන්වහන්සේගේ වචනය තුළින් අපගේ ආත්ම පෝෂණය කර ශක්තිමත් කර තෘප්තිමත් කරනු ලබන්නේය. නමුත් මෙය තවත් වැදගත් ප්‍රශ්නයකට අපව යොමු කරන්නේය. බයිබලය හුදෙක් අනෙකුත් පොත් මෙන් ප්‍රබෝධමත් කරන එකක්ද? නැතහොත් දේවානුභාවයෙන් පොළඹවනු ලැබ අපට දෙවියන්වහන්සේ විසින් දුන් එකක්ද? බයිබලය මිනිස් වර්ගයාට දුන් දෙවියන්වහන්සේගේ දිව්‍ය හෙළිදරව්වක් නම් අප එහි ඉගැන්වීම් අතපසු කරන විට අප සදාකාල විනාශයේ අනතුරකට මුහුණ දෙන්නෙමු. බයිබලය හුදෙක් මනුෂ්‍ය පෙළඹීමේ ලියවිල්ලක් නම්, එයට අප තුළ මූලික වෙනසක් ඇති කරන්නට කිසිදු බලයක් නැත. එබැවින් බයිබලය දේවානුභාවයෙන් දෙනු ලැබූ එකක්ද යනු වැදගත් ප්‍රශ්නයකි. සැබැවින්ම එය ජීවිතයත් මරණයත් අතර ඇති කරුණක් විය හැකිය. අප සාක්ෂිය සොයා බලමු.

## බයිබලයේ දිව්‍ය පෙළඹීම

පලස්තීනයේ දැඩි හිරු රස්නය තිබුණ දවසක අරාබි තරුණයෙක් මළ මුහුදට නුදුරු තැනක තම රැළට තණ කවමින් සිටියේය. එය ඔහුගේ ජීවිතයේ සාමාන්‍ය දවසක් විය. සෑම උදෑසනකම ඔහු දැවෙන කාන්තාරයේ තණකොළ සොයමින් තම බැටළු රැළ දක්කාගෙන ගියේය. මෙම දවස ලොව වෙනස් කරාවිය කියා ඔහුට අදහසක් නොතිබුණි.

ඔහුගේ රැළෙන් එක බැටළුවෙක් ගුහාවක් තුළට ගිය විට ඔහු ඌ බියගන්වන්නට ගුහාව තුළට ගලක් විසි කළේය. පුදුමයට මෙන් ඔහුට මැටි බඳුනක් බිඳුණු හඬ ඇසිණි. තමා සඟවා ඇති වටිනා සම්පතක් සොයා ගත්තා යැයි සිතමින් ඔහු එය තම පියාට කීමට නිවස කරා දිව ගියේය. එදින ඔවුන් සොයාගත්තේ ඉපැරණි උතුම් ධන සම්පතකට වඩා වටිනා එකක් විය. 1947 දී මළ මුහුදේ වෙරළ අසල ඉපැරණි හකුලන ලද පොත සොයාගන්නා ලදී. ගුහාවේ තිබුණ මැටි බඳුනේ වටිනා සම්පතක් තිබුණි. එහි බයිබලයේ ඉපැරණි අත්පිටපත් තිබුණි. මෙම හකුලන ලද පොත ක්‍රිස්තුස්වහන්සේගේ උපතට දළ වශයෙන් අවුරුදු 150ට පමණ පෙර කුම්රාන් ප්‍රජාව විසින් ලියන ලද්දකි. ඔවුහු බයිබලය අතින් ලියන්නට අවුරුදු ගණනාවක් ගත කළහ. එහි නිරවද්‍යතාවය සහතික කිරීමට පිටපත් කිරීමේදී ඔවුන්ගේ නීතිය ඉතා දැඩි විය. පුරාණ බයිබලීය භාෂාව සම්බන්ධ ප්‍රකට බයිබල් පණ්ඩිතයෝ විශේෂඥයෝ දසක ගණනාවක් මෙකී අත්පිටපත් සුපරීක්ෂාකාරීව සොයා බැලූහ. මෙකී පුරාණ හකුලන ලද පොත් බයිබලයේ නිරවද්‍යතාවයට හා සත්‍යතාවයට ප්‍රබලව සාක්ෂි දරන්නේය. මුහුදේ හකුලන ලද පොත්වලට අමතරව පැරණි ගිවිසුමේ පිටපත් ගණනාවක් මුල් ශත වර්ෂ වල හා ඉන් ඔබ්බට ලැබී ඇත. මෙකී අත්පිටපත් සියල්ලක්ම සැසඳීමේදී එහි නිරවද්‍යතාවයට හා විකාශනය කිරීමට යෝග්‍ය ලෙස සාක්ෂි දරන්නේය. පුරාණ ගිවිසුමට අමතරව අලුත් ගිවිසුමේ පිටපත් 2400 ට අධික ගණනාවක් පළමු හා සතරවන ශතවර්ෂ අතර කාලයේදී සොයාගනු ලැබිණ. බයිබලය ලොවේ අනෙකුත් ඕනෑම පොතකට වඩා පිටපත් කර නැවත නැවතත් පිටපත් කර ඇත. මෙම පිටපත්වල නිරවද්‍යභාවය බයිබලය දේවානුභාවයෙන් දුන් එකක් බවට සාක්ෂි දරන්නේය. එබැවින් ඔබත් බයිබලය නිතර පරිහරණය කරන්න. එනම් දිනපතා බයිබලය කියවන්න. ඉගෙන ගන්න. එමගින් ජීවිතයේ දුෂ්කර කාලවල් පසු කිරීමට අවශ්‍යය ශක්තිය ලැබෙනු ඇත.

**- ගුරුහරු -**

# Phone එක අතේ තිබුණාට දෙවියන්වහන්සේ අමතක කරන්න එපා.



Tiktok, Instagram, Youtube, Snapchat, Whatsapp, Facebook Scroll කරන ඇඟිල්ල වඩා බලවත් ඇඟිල්ලක් අපට තිබේ. ඒ දෙවියන්වහන්සේගේ ඇඟිල්ලයි. මොසෙස්ට සීනයි කඳු මුදුනේ ව්‍යවස්ථාව ලියා දුන් ඒ සර්ව බලධාරී ඇඟිල්ලයි. වර්තමාන තරුණ පරපුරේ මනස කා දමන්නේ ලෝකය පුරා ඇති සත්‍ය හා අසත්‍යය තොරතුරු දැනගැනීමෙන් නොව දෙවියන්වහන්සේගේ වචන නොදන්නා බැවිනි. එනම් පරම සත්‍යය නොදැනීමෙන්ය.

උදේ ඇහැරුන ගමන් Phone එක අතට අරන් Tiktok , Instagram , Youtube , Snapchat , Whatsapp , Facebook Scroll කරන අය දෙවියන්වහන්සේගේ වචනය Scroll කරන්න මිනිත්තු දෙකක් ඔබ දෙනවාද? ඒ පද දෙක තුන Phone Scroll කරන අය දෙවියන්වහන්සේගේ වචනය දෙස බැලීමට වැය කරන කාලයෙන් 0 කි **"තරුණයෙකු තමන්ගේ මාර්ගය පවිත්‍ර කරන්නේ කුමකින්ද, ඔබගේ වචනය ප්‍රකාර පැවැත්මෙනි" (ගීතාවලිය 119:9).**

Reel 100 – 1000, බැලුවත් අපගේ හදවතේ හිස් බව පිරෙන්නේ නැත. Tik Tok Videos කොතරම් බැලුවත් අපගේ මනස සෑහීමකට පත්වන්නේ නැත. **"මනුෂ්‍යයා ජීවත්වන්නේ කෑම වලින් පමණක් නොව දෙවියන්වහන්සේගේ මුඛයෙන් නික්මෙන වචනයෙන් බව යේසුස්වහන්සේ මතෙව් 4:4 පැවසූ සේක."**

Dark Room එකේ Phone Flashlight එකෙන් යම් දේවල් සොයාගන්නා සේම, සැබෑ ජීවිතය සොයා යන්න හොඳම Spotlight එක තමයි දේව වචනය.

බයිබලය කියවන්න වේලාව නෑ කියන තරුණයින් හරියට හුස්ම ගන්න වේලාවක් නෑ කියලා කියනවා වගේ දෙයක්.

තරුණ ජීවිත වියවුල් වී ඇත්තේ දෙවියන්වහන්සේගේ වචනය අතහැරීම නිසයි. ඔබගේ ජීවිතයේ GPS එක දේව වචනයයි. ඔබගේ Location එකට ළගා වීය හැක්කේ හා එය ලියා ඇත්තේ දෙවියන්වහන්සේගේ පොතේය. **" ඔබගේ වචන මාගේ පාද වලට පහනකි. මාගේ මාර්ගයට එළියකි" (ගීතාවලිය 119:105).**

ඔබගේ Phone එක Charge කරනවා වගේ ඔබගේ Spirit එකත් Charge කරගන්න ඕනෑ. දවසට විනාඩි 5ක් වචනය කන්න(කියවන්න). නැත්නම් ඔබගේ ආත්මය Malnutrition වෙනවා.

දේව වචනය ඔබගේ Memory එකට දාන්න. එවිට අවස්ථාවට හා පෙළඹවීමට අනුව ශුද්ධාත්මයාණන්වහන්සේ ඒක Auto Play කරනවා.

සභාවේ තරුණයන් දේව වචනය Scroll කරන්න පටන්ගත් දවසේට ස්වර්ගයෙන් Notification එවනවා නියතයි.

එබැවින් තරුණ තරුණියනි, Phone එක අතේ තිබුණාට ඔබේ මැවුම්කරුවාණන් හා ගැලවුම්කරුවාණන් අමතක කරන්න එපා, දේව වචනය අතේ තබාගෙන ජීවිතය හඹා යන්න.

**- ජීවන හඬ -**

# දිනපතා ආත්මික ව්‍යායාම

- ★ දිනපතා බයිබලය කියවන්න.
- ★ දිනපතා වේලාවක් වෙන් කරගෙන යාච්ඤා කරන්න.
- ★ දිනපතා දෙවියන්වහන්සේට ස්තූති, ප්‍රශංසා, නමස්කාර කරන්න. (නිවසේදී)
- ★ සෑම ඉරුදිනකම සභාවට යන්න.
- ★ ඔබගේ ආදායමෙන් දෙවියන්වහන්සේගේ කොටස වෙන් කර පූජා කරන්න.
- ★ සෑම විටම අන් අයට යහපත් ක්‍රියාවන් කරන්න.
- ★ සෑම විටම යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සුභාරංචිය තව කෙනෙකුට සරලව පවසන්න.
  - ★ අපේ පාප නිසා යේසුස්වහන්සේ මරණයට පත්වූ සේක.
  - ★ වලළනු ලැබූසේක.
  - ★ තුන්වෙනිදා මළවුන්ගෙන් නැගිට්ටසේක.
  - ★ අදද උන්වහන්සේ ජීවමානව වැඩ සිටින සේක.

www.christianfellowshipcentre.com

Cfc Colombo (Christian Fellowship Centre)

CFC Colombo


**ක්‍රිස්තියානි සහෝදර මධ්‍යස්ථානය**

අංක - 07, විවේකානන්ද පාර,
වැල්ලවත්ත,
කොළඹ 06.
දුරකථන අංක : 011 2 581 901 / 077 8 813 197
www.christianfellowshipcentre.com



NMA GRAPHICS
No. 246/1, Galle Road, Ratmalana.
Tel: 011 2 730 644 / 071 4 286 295 / 077 4 223 020
E-mail : nmagraphics2001@gmail.com